**2015 වර්ෂය සඳහා**
**ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ**
**කාර්ය සාධන වාර්තාව**

**ආචාර්ය ඒ.ජේ. සතරසිංහ**
**අධ්‍යක්ෂ ජනරාල්**

தொகைமதிப்பு புள்ளிவிபரத் திணைக்களத்தின்
**2015** ஆம் ஆண்டுக்கான
செயலாற்றுகை அறிக்கை

கலாநிதி ஏ.ஜே. சத்தரசிங்க
பணிப்பாளர் நாயகம்

# PERFORMANCE REPORT OF THE DEPARTMENT OF CENSUS AND STATISTICS FOR THE YEAR 2015

**Dr. A.J. Satharasinghe**
**DIRECTOR GENERAL**

# අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය

ශ්‍රී ලංකාවේ ජාතික සංඛ්‍යාන ආයතනය වන ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන වගකීම වන්නේ රජයට සහ වෙනත් දත්ත භාවිතා කරන්නන් හට අවශ්‍ය වන්නා වූ සංඛ්‍යාලේඛන රැස් කිරීම හා ප්‍රචලිත කිරීමයි. මෙරට ප්‍රජා විද්‍යාත්මක, සමාජ ආර්ථීක තත්වයන්ගේ විවිධ අංශයන්හි දත්ත රැස් කිරීම සහ සම්පාදනය කිරීමේ වගකීම ඇතුළුව සංඛ්‍යාන සේවයේ අවශ්‍ය වන්නා වූ රාජ්‍ය ආයතන සඳහා වෘත්තීය මට්ටමේ නිලධාරීන් පුහුණු කිරීමේ හා අනුයුක්ත කිරීමේ කටයුතු ද එයට පැවරී ඇත. එයට අමතරව සංඛ්‍යාන කටයුතු සඳහා සහාය අවශ්‍ය ආයතනයන් සඳහා සංඛ්‍යාන උපදේශන සේවාවන් ද එමඟින් ලබා දෙයි.

ගත වූ වර්ෂය තුළ දෙපාර්තමේන්තුව විසින් භාරගත් බොහෝ කාර්යයන් ඉතාමත් සාර්ථක අයුරින් නිම කිරීමට හැකි වීම සතුටට කරුණකි.

ඉකුත් වර්ෂයෙහි ආරම්භ කළ කාර්යයන් තව දුරටත් අඛණ්ඩව ඉදිරියට ගෙන යෑමට බලාපොරොත්තු වන අතරම 2015 වර්ෂයේ ඉලක්කයන් සපුරා ගැනීම සඳහා වගකීමෙන් හා කැපවීමෙන් යුතුව වෙහෙස නොබලා කටයුතු කල දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය වෙත මාගේ අවංක ස්තුතිය පිරිනමමි. එසේම දෙපාර්තමේන්තුවේ ඉලක්කයන් සපුරා ගැනීම සඳහා සහයෝගය දුන් රාජ්‍ය, පෞද්ගලික හා වෙනත් ආයතන වෙත මෙන්ම මහජනතාව වෙතද මාගේ ස්තුතිය පිරිනමමි.


ආචාර්ය ඒ.ජේ. සතරසිංහ
අධ්‍යක්ෂ ජනරාල්

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
"සංඛ්‍යාන මන්දිරය"
අංක 306/71, පොල්දූව පාර
බත්තරමුල්ල

| | |
|---|---|
| දුරකථන අංකය | : +94 11 2147001 |
| ෆැක්ස් | : +94 11 2147011 |
| විද්‍යුත් ලිපිනය | : dgcensus@statistics.gov.lk |
| වෙබ් අඩවිය | : www.statistics.gov.lk |

## පටුන

පිටුව


| | | |
|---|---|---|
| **1.** | **හැඳින්වීම** | **1** |
| **2.** | **දෙපාර්තමේන්තුව මගින් ඉටුකරනු ලබන කාර්යයන්** | **1** |
| **2.1** | **දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන සංගණන සහ සමීක්ෂණ** | **1** |
| 2.1.1 | ජන හා නිවාස සංගණනය - 2012 | 1 |
| 2.1.2 | ආර්ථික සංගණනය - 2013/14 | 2 |
| 2.1.3 | ගැටුම් හේතුවෙන් මියගිය/තුවාල ලැබූ පුද්ගලයින් හා දේපළ හානි පිළිබඳ සංගණනය - 2013 | 3 |
| 2.1.4 | රාජ්‍ය හා අර්ධ රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය පිළිබඳව සංගණනය | 3 |
| 2.1.5 | ප්‍රජා විද්‍යාත්මක හා සෞඛ්‍ය සමීක්ෂණය - 2014/15 | 3 |
| 2.1.6 | ගෘහ ඒකක ආදායම් සහ වියදම් සමීක්ෂණය - 2012/13 | 4 |
| 2.1.7 | ශ්‍රී ලංකාවේ ශ්‍රමබල සමීක්ෂණය | 4 |
| 2.1.8 | වී අස්වැන්න ඇස්තමේන්තු කිරීමේ සමීක්ෂණය | 5 |
| 2.1.9 | තේ, රබර්, පොල් නිෂ්පාදන වියදම් සමීක්ෂණය | 5 |
| 2.1.10 | කාර්මික නිෂ්පාදන පිළිබඳ ත්‍රෛමාසික සමීක්ෂණය - 2014 | 5 |
| 2.1.11 | වාර්ෂික ඉදිකිරීම් කර්මාන්ත සමීක්ෂණය - 2015 | 5 |
| 2.1.12 | වාර්ෂික කර්මාන්ත සමීක්ෂණය - 2015 | 5 |
| 2.1.13 | පරීක්ෂණාත්මක මිලදී ගැනීම් සමීක්ෂණය | 6 |
| 2.1.14 | පරිගණක සාක්ෂරතා සමීක්ෂණය | 6 |
| **2.2** | **මෙරට සමාජ ආර්ථික දත්ත එක්රැස් කිරීම සහ සකස් කිරීම සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව මගින් ඉටුකල අනෙකුත් සංඛ්‍යානමය කටයුතු** | **6** |
| 2.2.1 | වී පිළිබඳ සංඛ්‍යාලේඛන | 6 |
| 2.2.2 | ගොඩ ගොවිතැන් සංඛ්‍යාලේඛන හා සත්ව සංඛ්‍යාති | 6 |
| 2.2.3 | ආහාර ශේෂ පත්‍රය | 6 |
| 2.2.4 | කෘෂිකර්ම නිෂ්පාදන පරිමා දර්ශකය | 7 |
| 2.2.5 | ජාතික ගිණුම් | 7 |
| 2.2.6 | ජාතික පාරිභෝගික මිල දර්ශකය (NCPI) (පදනම 2013 = 100) | 8 |
| 2.2.7 | සිල්ලර සහ නිෂ්පාදකයාගේ මිල ගණන් | 9 |
| 2.2.8 | නිෂ්පාදකයාගේ මිල දර්ශකය (PPI) (පදනම 2013 Q4=100) | 10 |
| 2.2.9 | පළාත් පාලන සංඛ්‍යාති | 10 |
| 2.2.10 | පර්යේෂණ හා විශේෂ අධ්‍යයන කටයුතු | 11 |

2.2.11 ව්‍යාපාර පිළිබඳ සංඛ්‍යාන නාමාවලිය 13

2.2.12 ගොඩනැගිලි සංඛ්‍යාලේඛන 13

2.2.13 කාර්මික නිෂ්පාදන දර්ශකය (IIP) 14

2.2.14 පුහුණු කටයුතු 14

2.2.15 තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කටයුතු 15

2.2.16 ප්‍රකාශන කටයුතු 16

2.2.17 මුද්‍රණ කටයුතු 16

2.2.18 සිතියම් විද්‍යා කටයුතු 17

2.2.19 දත්ත නිකුත් කිරීමේ කටයුතු 18

2.2.20 පුස්තකාල සේවා 19

2.2.21 ක්ෂේත්‍ර කළමණාකරණ කටයුතු 20

**2.3 අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල ස්ථාපිත කර ඇති සංඛ්‍යාලේඛන ශාඛා කාර්යාල මගින් පවත්වනු ලබන සංගණන සහ සමීක්ෂණ 20**

2.3.1 වාර්ෂික රැකීරක්ෂා සමීක්ෂණය 20

2.3.2 සාමාන්‍ය ඉපැයීම් සහ වැඩ කල පැය ගණන පිළිබඳ සමීක්ෂණය 21

2.3.3 පඩිපාලක සහා අවම වැටුප් දර්ශකාංකය ගණනය කිරීම 21

2.3.4 කම්කරු සංඛ්‍යාති ප්‍රකාශනය ප්‍රකාශයට පත් කිරීම 21

2.3.5 අධ්‍යාපන සංඛ්‍යාති 21

2.3.6 වෛද්‍ය සංඛ්‍යාති 21

2.3.7 ජීව සංඛ්‍යාති 22

2.3.8 රේගු සංඛ්‍යාති 22

2.3.9 ධීවර සංඛ්‍යාති 23

**3. පරිපාලනය 23**

**3.1 අංශ, ශාඛා කාර්යාල හා දිස්ත්‍රික් කාර්යාල 23**

3.1.1 අංශ සහ ඒකක 23

3.1.2 අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල පිහිටි ශාඛා කාර්යාල 24

3.1.3 දිස්ත්‍රික් කාර්යාල 24

3.1.4 පළාත් සභාවල සංඛ්‍යාලේඛන කාර්ය මණ්ඩලය 24

**3.2 කාර්ය මණ්ඩලය 24**

**3.3 විදේශ සම්මේලන, සම්මන්ත්‍රණ හා වැඩමුළුවලට සහභාගීවීම - 2015 26**

**3.4 උසස්වීම්, පත්වීම්, මුදාහැරීම්, ඉල්ලා අස්වීම්, සේවය අතහැරයැම් හා විශ්‍රාමයැම් 35**

**3.5 අභ්‍යන්තර විගණන කටයුතු 36**

**4. මූල්‍ය වාර්තාව - 2015 37**

# වාර්ෂික කාර්ය සාධන වාර්තාව - 2015

## 1. හැඳින්වීම

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මෙරට සමාජ ආර්ථික තොරතුරු රැස් කිරීම, සකස් කිරීම, විශ්ලේෂණය කිරීම හා ප්‍රකාශයට පත් කිරීමේ වගකීම භාරව කටයුතු කරයි.

රාජ්‍ය ප්‍රතිපත්ති හා සැලසුම් සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම හා ප්‍රගතිය ඇගයීම සඳහා වන දර්ශක මෙම දෙපාර්තමේන්තුව විසින් සකස් කර ප්‍රකාශයට පත් කරනු ලබයි. මීට අමතරව මෙරට මහජනතාවට අවශ්‍ය තොරතුරු , දේශීය හා විදේශීය සංවිධාන ඇතුළු ආයතනයන්ට අවශ්‍ය තොරතුරු ද සම්පාදනය කරනු ලැබේ. දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන සංගණන හා සමීක්ෂණ පදනම්ව ආර්ථිකයේ කෘෂිකර්මය, කර්මාන්ත, වෙළඳාම, ජනගහනය, ජාතික ආදායම හා අනෙකුත් ප්‍රජා විද්‍යාත්මක තොරතුරු කාලීනව රැස් කිරීම තුලින් ඉහත අවශ්‍යතා ඉටු කර දීමට දෙපාර්තමේන්තුව නිරන්තරයෙන් කටයුතු කරයි.

### දැක්ම

දේශීය සංවර්ධන අභිමතාර්ථ සාක්ෂාත් කරගැනීම සඳහා කාලීන තොරතුරු ලබා දීම තුලින් කලාපයේ පෙර ගමන්කරු බවට පත්වීම.

### මෙහෙවර

ගෝලීයකරණ පසුබිමක් තුළ සමෘද්ධිමත් ජාතියක් බවට පත්වීම සඳහා නව තාක්ෂණය, සේවක කැපවීම සහ උපායශීලී නායකත්වය තුළින් කාලීන වූත් නිවැරදි වූත් දත්ත ලබා දීම මඟින් වඩාත් ඵලදායී ලෙස දේශයෙහි සමාජ ආර්ථික සංවර්ධනයට දායක වීම

## 2. දෙපාර්තමේන්තුව මගින් ඉටුකරනු ලබන කාර්යයන්

දෙපාර්තමේන්තුව මගින් ඉටුකරනු ලබන කාර්යයන් පුළුල් වශයෙන් පහත දැක්වේ.

2.1 දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන සංගණන සහ සමීක්ෂණ

2.2 මෙරට සමාජ ආර්ථික දත්ත එක්රැස් කිරීම සහ සකස් කිරීම සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව මගින් ඉටු කල අනෙකුත් සංඛ්‍යානමය කටයුතු

2.3 ඇතැම් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල ස්ථාපිත කර ඇති සංඛ්‍යාලේඛන ශාඛා කාර්යාල මගින් පවත්වනු ලබන සංගණන, සමීක්ෂණ සහ අනෙකුත් සංඛ්‍යානමය කටයුතු

## 2.1 දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන සංගණන සහ සමීක්ෂණ

### 2.1.1 ජන හා නිවාස සංගණනය - 2012

ජන හා නිවාස සංගණනය 2012 අවසන් වාර්තාව ප්‍රකාශයට පත් කර ඇති අතර “ජනගහනය” හා “නිවාස” තොරතුරු ඇතුලත් වාර්තාවන් මුද්‍රණය කර ප්‍රකාශයට පත් කර ඇත. තවද, ජන හා නිවාස සංගණනයේ පළාත් කිහිපයක වාර්තාවන් ප්‍රකාශයට පත් කර ඇති අතර ග්‍රාම නිලධාරි කොට්ඨාශ සඳහා වූ වාර්තාවන් දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කර ඇත.

එමෙන්ම ජන හා නිවාස සංගණනයේ තොරතුරු පදනම් කර ගනිමින් ශ්‍රී ලංකාවේ ඉහළ යන වැඩිහිටි ජනගහනය නම් වූ විශේෂ ප්‍රකාශයක් නිකුත් කර ඇති අතර සංගණනයේ ප්‍රධාන තොරතුරු ඉදිරිපත් කිරීම සඳහා විශේෂ සම්මන්ත්‍රණ 3 ක් පවත්වා ඇත.

## 2.1.2 ආර්ථික සංගණනය - 2013/14

ශ්‍රී ලංකාවේ ආර්ථික ක්ෂේත්‍රයේ ඇති ව්‍යුහාත්මක වෙනස්කම් හඳුනා ගැනීම සඳහා කෘෂිකර්ම, කර්මාන්ත, වෙළඳ හා සේවා යන ක්ෂේත්‍රයන් ආවරණය වන පරිදි ආර්ථික සංගණනය පවත්වන ලදී.

### I. කෘෂිකර්ම අංශය

මෙහි කෘෂිකර්ම අංශයේ තොරතුරු රැස් කිරීම මූලිකව අදියර 2 කින් සිදු කරන ලදී. පළමු අදියර යටතේ ශ්‍රී ලංකාවේ අක්කර 20 ට වැඩි සියලුම වතු ලැයිස්තු ගත කළ අතර එම තොරතුරු මත පදනම් වූ වාර්තාවක් ප්‍රකාශයට පත් කර ඇත. දෙවන අදියර යටතේ අනතුරුව කෘෂිකර්මාන්තයට අදාළ සියලුම ඒකක පිළිබඳ විස්තරාත්මක තොරතුරු රැස් කරන ලදී. ඒ අනුව මෙම අදියර යටතේ සියලුම විශාල ගොවිකාණ්ඩ: වතු හා කුඩා ගොවිකාණ්ඩ ආවරණය කරමින් ගොවි කාරකයින්,ගොවි කාරකයාගේ ගෘහ කාණ්ඩ පිළිබඳ, ඉඩම් භාවිතය හා භුක්තිය,ඒ ඒ බෝග යටතේ වගා කොට ඇති බිම් ප්‍රමාණ, මිරිදිය/කිවුල්දිය/කරදිය මත්ස්‍ය වගාව, ආදී විෂයයන්ට අදාල තොරතුරු රැස් කරන ලදී.

මෙම සංගණනයේදී රැස් කළ තොරතුරු භාවිතයෙන් පිළියෙල කරන වාර්තා අවස්ථා කිහිපයකදී නිකුත් කිරීමට නියමිතය. ඒ අනුව ක්ෂේත්‍රයේ දත්ත රැස් කරන අවස්ථාවේ පිළියෙල කරන ලද සාරාංශ වාර්තා ඇසුරෙන් මූලික වාර්තාවක් මේ වනවිට ප්‍රකාශයට පත් කර ඇත. එමෙන්ම රැස්කර ගන්නා තොරතුරු භාවිතයෙන් විස්තරාත්මක වාර්තාවක් දත්ත සැකසීමෙන් පසුව ප්‍රකාශයට පත් කරන අතර ජාතික, දිස්ත්‍රික්ක හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමේ සංඛ්‍යාති ප්‍රකාශයට පත් කිරීමක් එමගින් සිදු කරනු ලැබේ. ඒ අනුව ගොවි කාණ්ඩ සංඛ්‍යාව, ගොවි කාරකයින් සංඛ්‍යාව, එක් එක් බෝග වගාව යටතේ ඇති බිම් ප්‍රමාණය, කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණ භාවිතය, සත්ව පාලනය, මිරිදිය/කිවුල්දිය/කරදිය මත්ස්‍ය වගාව, ආදි විෂයයන්ට අදාල සංඛ්‍යාති ප්‍රකාශයට පත් කරනු ලබයි. මෙම වාර්තාව පිළියෙල කිරීමේ කටයුතු 2016 දෙසැම්බර් මාසය වන විට නිමකිරීමට අපේක්ෂිතය.

### II. කර්මාන්ත අංශය

ආර්ථික සංගණනයට අදාලව කර්මාන්ත, වෙළඳ හා සේවා අංශයන්ගේ තොරතුරු රැස් කිරීම අදියර දෙකක් යටතේ සිදු කරන ලදී.

* ආර්ථික ඒකක ලැයිස්තු ගත කිරීමේ අදියර
* විස්තරාත්මක දත්ත රැස්කිරීමේ අදියර

ආර්ථික ඒකක ලැයිස්තු ගත කිරීමේ අදියරට අදාල මූලික වාර්තාව සකස් කර දෙපාර්තමේන්තු වෙබ් අඩවිය මගින් ප්‍රකාශයට පත් කරන ලදී.

භාණ්ඩ හා සේවා කේත ලැයිස්තුවක් ලංකාවේ ආර්ථික කටයුතු වලට ගැලපෙන ආකාරයෙන් පිළියෙල කිරීම දෙපාර්තමේන්තුවේ සැහෙන කාලයක් මුළුල්ලේ වූ අවශ්‍යතාවයකි.

මෙවැනි කේත ලැයිස්තුවක් මෙතෙක් කල් නොපැවතීම හේතු කොට ගෙන කලින් කරන ලද ආර්ථික සංගණන හා කර්මාන්ත සමීක්ෂණ වල තොරතුරු කර්මාන්ත වර්ගීකරණ අනුව පමණක් ලබා දීමට සිදු වූ අතර එමගින් එම කර්මාන්ත වලින් නිෂ්පාදනය වූ භාණ්ඩ හා සේවා අනුව වර්ගීකරණය කිරීමට නොහැකි විය.

මේ හේතුව නිසාම එම සංගණන හා සමීක්ෂණ වලින් බලාපොරොත්තු වූ සමහර වටිනා තොරතුරු ගිලිහී ගිය අතර එයින් විස්තරාත්මක නිෂ්පාදන හා සේවා වල වර්ගීකරණය අතර "සැපයුම් හා භාවිතය " පිළිබඳ වගු හා " යෙදවුම් හා නිමවුම් " පිළිබඳ වගු පිළියෙල කිරීමටද තිබූ හැකියාව අවමව පැවතුනි.

මේ හේතුව නිසාම මෙම දෙපාර්තමේන්තුව අන්තර්ජාතික මධ්‍යම නිෂ්පාදන වර්ගීකරණය (Central Production Classification) ශ්‍රී ලංකාවට ගැලපෙන අයුරින් දේශීයකරණය කිරීමේ කටයුතු කොට එය ඉතා සාර්ථකව නිම කරන ලදී. එමගින් 2013/2014 වර්ෂයේ කරන ලද ආර්ථික සංගණනයට මෙම කේතකරණය යෙදීමට අවස්ථාව උදා වුනි. මේ යටතේ විධිමත් නිෂ්පාදන කර්මාන්ත වලට අදාල කේතකරණය අවසන් වී ඇති අතර ඒවායේ දත්ත පරිගණක ගත කිරීම මේ වන විට සිදුවෙමින් පවති. එසේම වෙළද, සේවා හා අවිධිමත් අංශ වලට අදාල උපලේඛන ද මේ වන විට කේත කරමින් පවති.

**III. ආර්ථික සිතියම් සංග්‍රහය 2014 (Economic Atlas 2014)**

අදාල දත්ත රැස් කිරීම, නිවැරදිභාවය පරීක්ෂාව, විශ්ලේෂණය කිරීම, භූගෝලීය දත්ත පද්ධතිය සකස් කිරීම සිදු කරන ලදී.

අන්තර්ගතය පිළිබඳව වාර්තාවක් සකස් කිරීම සහ යෝජිත ආදර්ශ (Draft) සිතියම් සකස් කිරීම සිදු කරන ලදී.

### 2.1.3 ගැටුම් හේතුවෙන් මියගිය/තුවාල ලැබූ පුද්ගලයින් හා දේපළ හානි පිළිබඳ සංගණනය - 2013

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව සහ රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය ඒකාබද්ධ ව 2013 වර්ෂයේදී මෙම සංගණනය පවත්වන ලදී. මෙහි මූලික වාර්තාව ලබා දී ඇති අතර සංගණන දත්ත සැකසුම් කටයුතු, වගු ලබා ගැනිම සහ අවසන් සංගණන වාර්තාව සකස් කරමින් පවතී.

### 2.1.4 රාජ්‍ය හා අර්ධ රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය පිළිබඳව සංගණනය

රටේ ප්‍රතිපත්ති සම්පාදනයට සහ ශ්‍රමබල සැලසුම් කිරීමට අවශ්‍ය රාජ්‍ය අංශයේ (මධ්‍යම සහ පළාත් රාජ්‍ය) සහ අර්ධ රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය පිළිබඳව සහ එම නිලධාරීන්ගේ ප්‍රජා විද්‍යාත්මක හා සමාජ ආර්ථික තොරතුරු පිළිබඳව නිවැරදි සංඛ්‍යාලේඛන රැස් කිරීම සඳහා උක්ත සංගණනය සැලසුම් කරන ලදී. මෙම සංගණනයේ මූලික සැලසුම් කටයුතු, ප්‍රශ්ණාවලිය සකස් කිරීම යනාදිය 2015 වර්ෂයේදී නිම කරන ලද අතර සංගණනය 2015 වසරේදී නොපවත්වන ලදී. මෙයට ප්‍රධාන හේතුව වූයේ රටේ පාර්ලිමේන්තු මැතිවරණයක් පැවැත්වීම සහ ඉන් අනතුරුව අමාත්‍යාංශ සහ එක් එක් අමාත්‍යාංශයට අයත් ආයතන ප්‍රසිද්ධ කරන තුරු සංගණන රාමුව වන ආයතන ලැයිස්තුව සකස් කිරීම සුදුසු නොවීමයි. මේ අනුව මෙම සංගණනය 2016 වර්ෂයේ දී සිදු කිරීමට කටයුතු සැලසුම් කරන ලදී.

### 2.1.5 ප්‍රජා විද්‍යාත්මක හා සෞඛ්‍ය සමීක්ෂණය - 2014/15

දත්ත භාවිතා කරන්නන්ගේ අදහස් හා යෝජනා අනුව සමීක්ෂණයේ මූලික ප්‍රශ්නාවලින් සකසා අදාල පුහුණු වැඩ සටහන හා ක්ෂේත්‍රයේ පූර්ව සමීක්ෂණ කටයුතු අවසන් කරන ලදී.

සෞඛ්‍ය අමාත්‍යාංශය සමඟ අවබෝධතා ගිවිසුමක්ද අත්සන් කරන ලදී. මෙම සමීක්ෂණය සඳහා Computer Assisted Personal Interviewing (CAPI) තාක්ෂණය යොදා ගැනීමට තීරණය වී ඇති බැවින් ICF ජාත්‍යන්තර ආයතනය මගින් ලබාදෙන උපදෙස් මත ප්‍රශ්නාවලිය සංශෝධනය කර භාෂා ත්‍රිත්වයෙන්ම සකස් කරමින් පවතී. එමෙන්ම තෝරා ගත් සංගණන කාණ්ඩ 2500 ක තොරතුරු යාවත්කාලීන කර ඇත. සමීක්ෂණය සඳහා අවශ්‍ය ඇතැම් භාණ්ඩ මිලදී ගැනීම සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් සිදුකරනු ලබයි. දත්ත රැස් කිරීම, විශ්ලේෂණය සහ ප්‍රකාශණය පිළිබඳ දත්ත 2016 වසරේ අවසන් කිරීමට නියමිතය.

## 2.1.6 ගෘහ ඒකක ආදායම් සහ වියදම් සමීක්ෂණය - 2012/13

ජාතික ගෘහ ඒකක නියැදි සමීක්ෂණ වැඩසටහන යටතේ ගෘහ ඒකක ආදායම් සහ වියදම් සමීක්ෂණය මෙම දෙපාර්තමේන්තුව මඟින් වසර 3 කට වරක් පවත්වනු ලබයි. මෙම සමීක්ෂණ මාලාවේ 8 වන සමීක්ෂණයේ ක්ෂේත්‍ර කටයුතු 2012 ජුලි මාසයේ ආරම්භ වූ අතර 2013 ජුනි මාසයේ අවසන් විය.

තොරතුරු රැස් කිරීම මුළු දිවයිනම ආවරණය වන පරිදි (මාසික) වට 12 කින් පැවැත්විණි. තොරතුරු ලබා ගන්නා උපලේඛනය, කාණ්ඩ 9 කින් සමන්විත වන අතර ප්‍රජා විද්‍යාත්මක තොරතුරු, පාසල් අධ්‍යාපනය, සෞඛ්‍යය, ගෘහ ඒකක ආදායම් හා වියදම්, ගෘහ ඒකකය සතුව ඇති කල් පවතින භාණ්ඩ, මූලික පහසුකම් ලබා ගැනීම, ගෘහ ඒකකයේ ණය ගැති භාවය, නිවාස හා සනීපාරක්ෂාව, ස්වාභාවික විපත්, ඉඩම් අයිතිය, සත්ත්ව පාලනය යන ක්ෂේත්‍ර වලට අදාලව තොරතුරු රැස් කරන ලදී.

මෙම සමීක්ෂණයට අදාල මාස 12 ම ඇතුලත් සාරාංශ වාර්තාව ප්‍රකාශයට පත් කරන ලදී.

**වගුව 1 : ගෘහ ඒකක ආදායම් සහ වියදම් සමීක්ෂණය 2012/13 - ජාතික මට්ටමේ දර්ශක**

| දර්ශකය | ඒකකය | වටිනාකම |
|---|---|---|
| මාසික ගෘහ ඒකක මධ්‍යන්‍යය ආදායම | රු. | 45,878 |
| මාසික ගෘහ ඒකක මධ්‍යස්ථ ආදායම | රු. | 30,814 |
| මාසික ගෘහ ඒකක මධ්‍යන්‍යය ඒක පුද්ගල ආදායම | රු. | 11,819 |
| ආදායම් උපයන්නන්ගේ මාසික ගෘහ ඒකක මධ්‍යන්‍යය ආදායම | රු. | 25,963 |
| ගෘහ ඒකක ආදායම සඳහා ගිනි සංගුණකය | - | 0.48 |
| මාසික ගෘහ ඒකක මධ්‍යන්‍යය වියදම | රු. | 41,444 |
| ආහාර වියදම් අනුපාතිකය | %. | 37.8 |
| ජනගහන දරිද්‍රතා දර්ශකය | % | 6.7 |

## 2.1.7 ශ්‍රී ලංකාවේ ශ්‍රමබල සමීක්ෂණය

ශ්‍රී ලංකාවේ ශ්‍රම බලකාය, සේවා නියුක්තිය සහ සේවා වියුක්ති මට්ටම් සහ ඒවායේ උපනතීන් පිළිබඳ මැන බැලීම සඳහා 1990 වර්ෂයේ පලමු කාර්තුවේ සිට නොකඩවා කාර්තු මට්ටමෙන් මෙම සමීක්ෂණය සිදු කරනු ලබයි. 2015 වර්ෂය සඳහා වූ මෙම සමීක්ෂණයේ ක්ෂේත්‍ර කටයුතු ජනවාරි සිට දෙසැම්බර් මස දක්වා මාස 12 ම ආවරණය වන පරිදි සියලුම දිස්ත්‍රික්කයන් හි සිදු කර ඇත.

ශ්‍රම බල සමීක්ෂණයේ වාර්ෂික වාර්තාව 2014 මුද්‍රණය කර බෙදා හැර ඇති අතර දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ ද පලකර ඇත. තව ද 2015 වර්ෂය සඳහා I,II සහ III කාර්තුගත වාර්තාවන් සහ පළමු මාස 6 සඳහා වූ පරිගණක සාක්ෂරතාවය පිළිබඳ පුවත් විවරණිකාව ද ප්‍රකාශයට පත් කර ඇත.

**වගුව 2 : ශ්‍රී ලංකාවේ ශ්‍රම බල සමීක්ෂණය 2015 - තෙවැනි කාර්තුව**

| දර්ශකය | ශ්‍රී ලංකාව | පුරුෂ | ස්ත්‍රී |
|---|---|---|---|
| ශ්‍රම බලකාය(වයස අවු :15 හා ඊට වැඩි ) ('000) | 9,008 | 5,810 | 3,197 |
| සේවා වියුක්ති ජනගහනය ('000) | 454 | 205 | 249 |
| ශ්‍රම බල සහභාගීත්ව අනුපාතිකය (%) | 53.8 | 74.7 | 35.7 |
| සේවා වියුක්ති අනුපාතිකය (%) | 5.0 | 3.5 | 7.8 |

### 2.1.8 වී අස්වැන්න ඇස්තමේන්තු කිරීමේ සමීක්ෂණය

2014/2015 මහ කන්නය හා 2015 යල කන්නය සඳහා වී වගා කරන ලද බිම් ප්‍රමාණය, සාමාන්‍ය අස්වැන්න සහ මුළු නිෂ්පාදනය ඇස්තමේන්තු කිරීම සිදු කරන ලදී. මෙහිදී ජාතික මට්ටමින් හා දිස්ත්‍රික් මට්ටමින් එක් එක් කන්නය තුළ, වී වගා කරන ලද සහ අස්වැන්න නෙලා ගත් බිම් ප්‍රමාණයන් ගණනය කිරීම සඳහා, වී අස්වැන්න ඇස්තමේන්තු කිරීම සඳහා වන සමීක්ෂණ පවත්වන්නට යෙදුනි.

2014/2015 මහ කන්නය හා 2015 යල කන්නය සඳහා ඒ ඒ දිස්ත්‍රික්කවල වී වගා කෙරෙන ප්‍රභේද නියෝජනය වන අකාරයට අක්කරයට/ හෙක්ටයාරයකට වී අස්වැන්න ඇස්තමේන්තු කිරීම වෙනුවෙන් මෙම සමීක්ෂණ පවත්වන ලදී.

ඉහත සමීක්ෂණයට සමගාමීව වී වගාව පිළිබඳ උපාශ්‍රිත තොරතුරු වන, එක් එක් වී වර්ග අනුව වගා කොට ඇති බිම් ප්‍රමාණයන්, බිම් සකස් කරන ලද ආකාරය, පොහොර භාවිතය හා වල්නාශක භාවිතය වැනි විචල්‍යයන් පිළිබඳ දත්තයන් ද එක් රැස් කරන ලදී.

### 2.1.9 තේ, රබර්, පොල් නිෂ්පාදන වියදම් සමීක්ෂණය

2014/2015 වර්ෂ සඳහා තේ, රබර් සහ පොල් යන ප්‍රධාන භෝගයන්ගේ නිෂ්පාදන වියදම් ගණනය කිරීමේ කටයුතු සිදු කරන ලදී. තේ කිලෝග්‍රෑමයක නිෂ්පාදන වියදම ගණනය කිරීමට අදාල විස්තරාත්මක තොරතුරු ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ, තේ කොමසාරිස් අංශයේ සහාය ඇතිව එම කාර්යාලයෙහි ලියාපදිංචි තේ කම්හල් වලින් එක් රැස් කරන ලදී. රබර් නිෂ්පාදන වියදම් ගණනය කිරීමේදී රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ සහයෝගය ඇතිව පවත්වනු ලබන සමීක්ෂණය පදනම් කර ගනු ලැබීය. මෙම සමීක්ෂණ මගින් ලබා ගන්නා දත්ත 2014/2015 වගා වර්ෂය සඳහා තේ, රබර් සහ පොල් වල නිෂ්පාදන වියදම් ගණනය කිරීමේ කටයුතු සිදු කරන ලදී.

### 2.1.10 කාර්මික නිෂ්පාදන පිළිබඳ ත්‍රෛයිමාසික සමීක්ෂණය - 2014

කාර්මික නිෂ්පාදන ආයතන වල නිෂ්පාදන මට්ටම, අමුද්‍රව්‍ය පරිභෝජනය, යෙදවුම්, ඉපයීම් හා සේවා නියුක්තිය පිළිබඳ කාලීන තොරතුරු ලබා ගැනීම සඳහා මෙම සමීක්ෂණය සැලසුම් කර ඇත.

2015 තෙවැනි කාර්තුව දක්වා ක්ෂේත්‍ර කටයුතු සිදුකල අතර ජාතික ගිණුම් සැකසීම සඳහා අවශ්‍ය තොරතුරු කාර්තුගත ව සැපයීම සිදු කරන ලදී. අදාල අවසන් වාර්තාව 2015 වර්ෂයේදී තෙවැනි කාර්තුවේ දී ප්‍රකාශයට පත් කරන ලදී.

### 2.1.11 වාර්ෂික ඉදිකිරීම් කර්මාන්ත සමීක්ෂණය - 2015

සමීක්ෂණය සඳහා අදාල වූ ප්‍රශ්නාවලීන් යාවත්කාලීන කිරීම සඳහා අනෙකුත් අංශ වල යෝජනා සහ අදහස් අනුව සිදු කරන ලදී. තෝරා ගත් නියැදිය භාවිතා කොට දත්ත එකතු කිරීමේ කටයුතු මේ වන විට අවසන් කොට ඇත.

### 2.1.12 වාර්ෂික කර්මාන්ත සමීක්ෂණය - 2015

මේ සඳහා අදාල වූ ප්‍රශ්නාවලීන් යාවත්කාලීන කිරීම සඳහා අනිකුත් අංශ වලින් යෝජනා සහ අදහස් ලබා ගන්නා ලදී. ප්‍රශ්නාවලීන් සැකසීම, නියැදිය තෝරා ගැනීම, ආයතනික රාමුව සැකසීම සහ ක්ෂේත්‍ර කටයුතු ද අවසන් කරන ලදී.

### 2.1.13 පරීක්ෂණාත්මක මිලදී ගැනීම් සමීක්ෂණය

සෑම මසකම කොළඹ පාරිභෝගික මිල දර්ශකය ගණනය කර ප්‍රකාශයට පත් කිරීම සඳහා අවශ්‍ය මිල තොරතුරු ලබා ගැනීමට මිල හා වේතන අංශයේ නිලධාරීන් විසින් කොළඹ දිස්ත්‍රික්කයේ නාගරික ප්‍රදේශ ආවරණය වන පරිදි පරීක්ෂණාත්මක මිලදී ගැනීමේ සමීක්ෂණය සිදුකරනු ලැබේ.

මෙහිදී තෝරාගත් භාණ්ඩ හා සේවාවන් හි මිල තොරතුරු අඛණ්ඩව තෝරා ගත් වෙළඳ සැල් වලින් එක් එක් භාණ්ඩය සඳහා සකසා ඇති පිරිවිතර තත්වයන්ට අනුකූලව එක් රැස් කරනු ලැබේ. ගෘහ ඒකකයන්ගේ නවතම වියදම් රටාව විදහා දැක්වීමට මෙම තොරතුරු භාවිතා කරනු ලබන අතර මෙම පරීක්ෂණාත්මක මිලදී ගැනීමේ සමීක්ෂණයේ තොරතුරු මගින් කොළඹ පාරිභෝගික මිල දර්ශකය(CCPI) ගණනය කිරීම සහ ප්‍රකාශයට පත් කිරීම සිදු කරනු ලැබේ.

### 2.1.14 පරිගණක සාක්ෂරතා සමීක්ෂණය

අධ්‍යාපන අමාත්‍යාංශය සහ ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව ඒකාබද්ධව පාසල් සිසුන්ගේ සහ ගුරුවරුන්ගේ පරිගණක සාක්ෂරතාවය මැනීම සඳහා ශ්‍රී ලංකාවේ රජයේ පාසල් සහ රජයේ අනුමත පුද්ගලික පාසල් වල 2014 වර්ෂයේදී මෙම සමීක්ෂණය පවත්වන ලදී. සමීක්ෂණය සඳහා තාක්ෂණික සහාය ලබා දීම මෙම දෙපාර්තමේන්තුව මගින් සිදුකරනු ලබන අතර දත්ත පරිගණකගත කිරීම සඳහා අවශ්‍ය පරිගණක වැඩසටහන් සකසා දීම සහ දත්ත පරිගණකගත කිරීමේ අනෙකුත් කටයුතු සඳහා තාක්ෂණික සහාය ලබා දීම 2015 වර්ෂයේදි සිදු කරන ලදී.

## 2.2 මෙරට සමාජ ආර්ථික දත්ත එක්රැස් කිරීම සහ සකස් කිරීම සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව මගින් ඉටුකල අනෙකුත් සංඛ්‍යානමය කටයුතු

### 2.2.1 වී පිළිබඳ සංඛ්‍යාලේඛන

වී අස්වැන්න ඇස්තමේන්තු කිරීමේ සමීක්ෂණයෙන් ලබා ගත් දත්ත විග්‍රහ කොට මහ සහ යල කන්න සඳහා දිස්ත්‍රික් මට්ටමින් තොරතුරු ප්‍රකාශයට පත්කරන ලදී. එමෙන් ම, මහවැලි බල ප්‍රදේශ වල කුඩා කළමනාකරණ කොට්ඨාශ මට්ටමින්ද, ඉහත දක්වන ලද සංඛ්‍යාතීන් පිළියෙල කර වෙබ් අඩවියේ ප්‍රකාශයට පත්කරන ලදී.

### 2.2.2 ගොඩ ගොවිතැන් සංඛ්‍යාලේඛන හා සත්ව සංඛ්‍යාති

කන්න මට්ටමින් වාර්තාකරුවන්ගේ සහාය ඇතිව එක්රැස් කරනු ලබන උස්බිම් වල වගාකරන භෝගවල බිම් ප්‍රමාණය, නිෂ්පාදනය හා සත්ත්ව පාලනයට අදාල වාර්ෂිකව රැස් කරනු ලබන සංඛ්‍යාතීන් සංරාංශගත කර රජයේ ප්‍රතිපත්ති සම්පාදකයින් හා අනෙකුත් ආයතනවලට දත්ත ලබාදීම සිදුකල අතර වෙබ් අඩවියට ද ඇතුලත් කරන ලදී.

මෙහිදී ස්ථිර බෝග සහ කාලීන බෝග යටතේ සුළු අපනයන බෝග, පළතුරු, එළවළු, ධාන්‍ය වර්ග හා රනිල බෝග ඇතුළුව බෝග වර්ග 60 ක් පමණ ආවරණය වන පරිදි වගා කරන ලද බිම් ප්‍රමාණය සහ අස්වැන්න මහ සහ යල කන්න සඳහා ඇස්තමේන්තු කර ප්‍රකාශයට පත් කරනු ලැබීය.

### 2.2.3 ආහාර ශේෂ පත්‍රය

වාර්ෂිකව පිළියෙල කරනු ලබන ආහාර ශේෂ පත්‍රය මගින් ඒක පුද්ගල ආහාර සැපයුම පෙන්නුම් කරන අතර එමගින් රටේ පවතින පෝෂණ තත්ත්වය ජාතික මට්ටමින් පිළිබිඹු වේ. 2014 වර්ෂයේ කෘෂිකාර්මික නිෂ්පාදන සැලකිල්ලට ගෙන 2014 වර්ෂයේ ඒක පුද්ගල ආහාර සැපයුම පිළිබඳ ඇස්තමේන්තු පිලියෙල කරන ලදී.

## 2.2.4 කෘෂිකර්ම නිෂ්පාදන පරිමා දර්ශකය

කෘෂි කාර්මික නිෂ්පාදනයන් හි ඇතිවී තිබෙන ප්‍රමාණාත්මක වෙනස්කම් පසුගිය වර්ෂ වලට සාපේක්ෂව විශ්ලේෂණය කිරීමේ අරමුණින්, කෘෂිකාර්මික නිෂ්පාදන පිළිබඳ වාර්ෂික පරිමා දර්ශකය පිළියෙල කරන අතර වී, ප්‍රධාන අපනයන භෝග, රළු ධාන්‍ය, අනෙකුත් කාලීන භෝග, එලවළු , පලතුරු සුළු අපනයන භෝග හා පශු ධන නිෂ්පාදන යන අංශ සඳහා වෙන් වශයෙන් ඉදිරිපත් කරනු ලබයි. මේ සඳහා දැනට පාදක වර්ෂය ලෙස 2002 වර්ෂය සලකනු ලබයි. 2014 වර්ෂයේ කෘෂි කාර්මික නිෂ්පාදන සැලකිල්ලට ගනිමින් එම වර්ෂය සඳහා පරිමා දර්ශකය පිලියෙල කර ඇත.

## 2.2.5 ජාතික ගිණුම්

ශ්‍රී ලංකාවේ ජාතික ගිණුම් සකස් කිරීමේ නිල වගකීම ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවට පැවරී ඇති අතර කාර්තුමය හා වාර්ෂික ව ජාතික ගිණුම් සැකසීම සිදු කරනු ලබයි.

වසර 2002 න් පසු රටේ පැවැති නව ආර්ථික ව්‍යුහය හේතු කොට ගෙන දළ දේශීය නිෂ්පාදිතය නිවැරදිව ගණනය කිරීමේ අවශ්‍යතාවය පැන නැගුනි. ඒ අනුව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විශේෂඥ සේවාවන් මත 2015 වර්ෂයේදී ජාතික ගිණුම් ගණනය කිරීමේ පාද වර්ෂය 2002 සිට 2010 දක්වා ඉදිරියට ගෙන ඒමේ ක්‍රියාවලිය ඉතා සාර්ථකව නිම කල අතර 2010 පදනම් වර්ෂය යටතේ 2010 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා ජාතික ගිණුම් නැවත නව ක්‍රමවේදයට අනුව නිකුත් කෙරින. ජාතික ගිණුම් ගණනය කිරීම සඳහා මෙතෙක් භාවිතා කල පැරණි ක්‍රමවේදය වෙනුවට එක්සත් ජාතීන් විසින් අනුමත කල, SNA 2008 නවතම ක්‍රමවේදය යොදාගත් අතර ISIC Rivision 4 (International Standard Industrial Classification), CPC (Central Product Classification) හා අනෙකුත් අන්තර් ජාතික වර්ගීකරණයන් භාවිතා කරන ලදී.

තවද, 2010 පාද වර්ෂයට අනුව ජාතික ගිණුම් ප්‍රකාශයට පත් කිරීම සඳහා, දෙපාර්තමේන්තු වෙබ් අඩවිය තුල නව වෙබ් පිටුවක් ආරම්භ කිරීම සහ 2002 පාද වර්ෂය යටතේ තවදුරටත් 2014 අවසන් කාර්තුවේ සිට 2015 තෙවන කාර්තුව දක්වා ජාතික ගිණුම් ප්‍රකාශයට පත් කරන ලදී. එමෙන්ම, 2002 පාද වර්ෂයට අනුව සකස් කරන ලද 2014 වර්ෂයේ ජාතික ගිණුම් වාර්තාව ද නිකුත් කෙරිනි.

2015 වසර තුලදී 2010 පාද වර්ෂය ලෙස ගෙන සකසන ලද ජාතික ගිණුම් සංඛ්‍යාතීන් සහ ඊට අදාල ප්‍රකාශන පහත දැක්වේ.

1. දළ ජාතික නිෂ්පාදිතය ඇතුළු සියළුම සාර්ව ආර්ථික සංඛ්‍යාතීන් නිෂ්පාදන, ආදායම් සහ වියදම් ප්‍රවේශයන් යටතේ 2010-2014 දක්වා වාර්ෂිකව නැවත ගණනය කර නිකුත් කිරීම සහ වෙබ් අඩවිය මගින් ප්‍රකාශයට පත් කිරීම.
2. දළ ජාතික නිෂ්පාදිතය නිෂ්පාදන ප්‍රවේශය අනුව 2015 පළමු, දෙවන හා තෙවැනි කාර්තු සඳහා නිකුත් කිරීම.
3. ජාතික ගිණුම් හි පාද වර්ෂය වෙනස් කිරීම සම්බන්ධව වැඩමුළු 4 ක් සහ මාධ්‍ය දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී.
4. ශ්‍රී ලංකාවේ ආර්ථික ක්‍රියාකාරකම් මගින් ලබාදෙන භාණ්ඩ හා සේවාවන් හි නිමැවුම, අතරමැදි, අවසන් පරිභෝජනය, ආනයන, අපනයන සහ ප්‍රාග්ධන සම්පාදනය යන කරුණු පිළිබිඹු කරමින් 2010 වර්ෂය සඳහා සැපයුම් සහ භාවිතා වගුව සකසන ලදී.

**වගුව 3 : වාර්ෂික ජාතික ගිණුම් ඇස්තමේන්තුවල ප්‍රධාන දර්ශක 2010-2014 (2010 පාද වර්ෂය යටතේ)**

| දර්ශකය | 2010 | 2011 | 2012 | 2013 | 2014 |
|---|---|---|---|---|---|
| දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය(%) | | 8.4 | 9.1 | 3.4 | 4.5 |
| ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතය (රුපියල්) | 320,171 | 357,116 | 427,559 | 466,112 | 495,478 |
| ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතය (ඇමෙරිකානු ඩොලර්) | 2,832 | 3,230 | 3,351 | 3,610 | 3,795 |
| ඒක පුද්ගල දළ ජාතික ආදායම (රුපියල්) | 316,688 | 353,553 | 419,975 | 455,126 | 483,921 |
| ඒක පුද්ගල දළ ජාතික ආදායම (ඇමෙරිකානු ඩොලර්) | 2,801 | 3,198 | 3,291 | 3,525 | 3,707 |
| ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතය (ඇමෙරිකානු ඩොලර්) වර්ධනය (%) | | 14.1 | 3.8 | 7.7 | 5.1 |
| ඒක පුද්ගල දළ ජාතික ආදායම (ඇමෙරිකානු ඩොලර්) වර්ධනය (%) | | 14.2 | 2.9 | 7.1 | 5.2 |
| දළ දේශීය නිෂ්පාදිතයේ ගම්‍ය මිල දර්ශකය (2002=100) | 100 | 104 | 115 | 122 | 126 |
| දළ දේශීය නිෂ්පාදිතයේ ගම්‍ය මිල දර්ශකය අනුව උද්ධමනය (%) | | 3.8 | 10.8 | 6.2 | 2.7 |

**වගුව 4 : 2015 වර්ෂය තුල ප්‍රකාශයට පත් කරන ලද කාර්තුගත ජාතික ගිණුම් ඇස්තමේන්තුවල ප්‍රධාන දර්ශක (2010 පාද වර්ෂය යටතේ)**

| දර්ශකය | 2010 | | | 2011 | | | 2012 | | | 2013 | | | 2014 | | | 2015 | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | කාර්තු | | | කාර්තු | | | කාර්තු | | | කාර්තු | | | කාර්තු | | | කාර්තු | | |
| | 1 | 2 | 3 | 1 | 2 | 3 | 1 | 2 | 3 | 1 | 2 | 3 | 1 | 2 | 3 | 1 | 2 | 3 |
| දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය (%) | - | - | - | 9.8 | 7.2 | 9.2 | 16.1 | 9.7 | 5.2 | 3.6 | 5.9 | 4.0 | 0.7 | 1.9 | 4.7 | 4.4 | 6.7 | 4.8 |
| දළ දේශීය නිෂ්පාදිතයේ ගම්‍ය මිල දර්ශකය (2002=100) | 100.6 | 100.8 | 98.0 | 111.1 | 105.4 | 103.5 | 118.7 | 116.8 | 115.6 | 128.8 | 122.9 | 123.3 | 132.6 | 128.0 | 125.9 | 139.4 | 132.1 | 133.1 |
| දළ දේශීය නිෂ්පාදිතයේ ගම්‍ය මිල දර්ශකය අනුව උද්ධමනය (%) | - | - | - | 10.4 | 4.5 | 5.6 | 6.8 | 10.8 | 11.7 | 8.5 | 5.2 | 6.7 | 3.0 | 4.2 | 2.1 | 5.1 | 3.2 | 5.7 |

## 2.2.6 ජාතික පාරිභෝගික මිල දර්ශකය (NCPI) (පදනම 2013 = 100)

ශ්‍රී ලංකාවේ උද්ධමනය මැනීමේ නිල මිනුම ලෙස 2011 ජුනි මාසයේ සිට කොළඹ පාරිභෝගික මිල දර්ශකය(CCPI) (පදනම 2006/07=100) භාවිතා කරන ලදී. මුලු රටම ආවරණය වන පරිදි මිල වෙනස්වීම් ගණනය කිරීම සඳහා වන දර්ශකයක අවශ්‍යතාවය පෙනී ගිය බැවින් දෙපාර්තමේන්තුව විසින් නවතම පාරිභෝගික මිල දර්ශකය වන ජාතික පාරිභෝගික මිල දර්ශකය (NCPI) (පදනම 2013=100) 2015

ඔක්තෝබර් මස සිට උද්ධමනය මැනීමේ නිල මිනුම් දණ්ඩ ලෙස හඳුන්වා දෙන ලදී. මෙම දර්ශකය අදාල ලිත් මාසය අවසන් වී දින 21 කට පසු ප්‍රකාශයට පත් කරනු ලැබේ.

රටේ සෑම ගෘහ කාණ්ඩයක් ම නියෝජනය වන පරිදි ගෘහ ඒකක ආදායම් හා වියදම් සමීක්ෂණය 2012/13 පාරිභෝගික වියදම් රටාව පිලිබිඹු වන ආකාරයට බර තැබීම සිදු කල අතර ජාත්‍යන්තර ක්‍රම වේදයන්ට අනුව යමින් ශ්‍රී ලංකාවේ පළාත් නවයම ආවරණය වන පරිදි මිල ගණන් එක් රැස් කිරීම සිදුකරනු ලබයි. සෑම දිස්ත්‍රික්කයක ම ප්‍රධාන නගරයේ මිල රැස් කරන මධ්‍යස්ථාන 3 කින් භාණ්ඩ පැස සඳහා මිල ගණන් රැස් කරනු ලැබේ.

**වගු අංක 5: ජාතික පාරිභෝගික මිල දර්ශකයේ විචලනය (පදනම 2013=100)**

| මාසය | දර්ශක අගය | |
|---|---|---|
| | **2014** | **2015** |
| ජනවාරි | 103.1 | 112.8 |
| පෙබරවාරි | 103.0 | 108.9 |
| මාර්තු | 103.2 | 107.6 |
| අප්‍රේල් | 104.1 | 107.0 |
| මැයි | 104.9 | 108.0 |
| ජූනි | 106.2 | 109.1 |
| ජූලි | 107.0 | 108.9 |
| අගෝස්තු | 106.4 | 108.4 |
| සැප්තැම්බර් | 106.4 | 108.4 |
| ඔක්තෝම්බර් | 106.0 | 109.2 |
| නොවැම්බර් | 106.9 | 112.0 |
| දෙසැම්බර් | 108.6 | 113.2 |

### 2.2.7 සිල්ලර සහ නිෂ්පාදකයාගේ මිල ගණන්

නාගරික සිල්ලර මිල ගණන් හා නිෂ්පාදකයාගේ මිල ගණන් රැස් කිරීමේ දී ක්‍රියා පිළිවෙල වැඩි දියුණු කිරීම සඳහා, 2015 වර්ෂයේ දෙවන කාර්තුවේ සිට නාගරික සිල්ලර මිල ගණන් රැස් කිරීමේ පෝරම පලාත් මට්ටමින් සංශෝධනය කරන ලදී. සියලුම දිස්ත්‍රික්ක වල ප්‍රධාන නගරයන්හි ආහාර හා විවිධ පාරිභෝගික භාණ්ඩ පිලිබඳ සිල්ලර මිල ගණන් සතිපතා, සති දෙකකට වරක්, මාසිකව හා කාර්තුමය පදනමක් මත එක් රැස් කරනු ලබන අතර මෙරට ආහාර බෝග වගා කරන්නන්ගේ මිල ගණන් ද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ක්‍රමවත්ව, මාසිකව දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍ර සංඛ්‍යාන කාර්ය මණ්ඩලය යොදා ගැනීමෙන් එක් රැස් කර මිල හා වේතන අංශය වෙත ගෙන්වා ගනු ලැබේ. මෙම තොරතුරු ඇතුලත් කර 2014 ජනවාරි සිට 2014 දෙසැම්බර් දක්වා සතිපතා සිල්ලර මිල ගණන් (කොළඹ දිස්ත්‍රික්කය) හි මිල විවරණිකාවේ 23 වන නිකුතුව මුද්‍රණය කර ප්‍රකාශයට පත් කරන ලදී. 2011-2014 දක්වා විස්තර ඇතුලත් සිල්ලර සහ නිෂ්පාදකයාගේ මිල ගණන් පිලිබඳ විවරණිකාවේ 32 වැනි නිකුතුව ද මුද්‍රණය කර ප්‍රකාශනයට පත් කරන ලදී.

තවද, මෙම සිල්ලර සහ නිෂ්පාදකයාගේ මිල ගණන් ජාතික ගිණුම් ගණනය කිරීම සඳහා කාර්තුමය වශයෙන් ජාතික ගිණුම් අංශයට ලබා දෙනු ලැබේ. මෙයට අමතරව දත්ත භාවිතා කරන්නන්ගේ අවශ්‍යතාවයන් සඳහා ද මෙම තොරතුරු ලබා දීමට කටයුතු සලසා ඇත. අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍ය, විවෘත වෙළඳ පොළ සිල්ලර මිල ගණන් විවරණිකාව ජනාධිපති ලේකම්, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ අදාළ නිළධාරින් වෙත සතිපතා ඉදිරිපත් කරනු ලැබේ. මෙම මිල ගණන් දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ ද ප්‍රකාශයට පත් කරනු ලැබේ. 2015 වර්ෂය සඳහා යුද හමුදා නිළධාරින්ගේ සහ අනෙකුත් තරාතිරම් වල පුද්ගලයන්ගේ සලාක වට්නාකම ගණනය කර යුද හමුදාපති වෙත ඉදිරිපත් කිරීම ද සිදු කරනු ලැබේ.

## 2.2.8 නිෂ්පාදකයාගේ මිල දර්ශකය (PPI) (පදනම 2013 Q4=100)

රටක ජාතික සංඛ්‍යාලේඛන වැඩසටහනට ඇතුලත් වන මූලික විෂයයක් ලෙස නිෂ්පාදකයාගේ මිල දර්ශකය හැදින්විය හැකි අතර දේශීය නිෂ්පාදකයා තම නිපැයුම් වලට ලබා ගන්නා මිලේ සිදුවන වෙනස් වීම මෙමගින් මනිනු ලැබේ. ශ්‍රී ලංකාවේ ජාතික ගිණුම් ගණනය කිරීම සඳහා මෙන්ම එහි ගුණාත්මක භාවය වැඩිදියුණු කිරීම සඳහාද මෙම මිල දර්ශකය ඉතා අවශ්‍ය මෙවලමකි. එමෙන්ම ශ්‍රී ලංකා මහ බැංකුව වැනි ආයතන හා රටේ නීති සම්පාදකයින් මෙන්ම ප්‍රතිපත්ති සැලැසුම් කරන්නන්ටද මෙම දර්ශකාංකය භාවිතා කිරීමට උනන්දු වෙති.

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලය මගින් මාසිකව එක් අයිතමයක් සඳහා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මධ්‍යස්ථාන 3 කින් කෘෂිකාර්මික මිල ගනන් එක් රැස් කරනු ලබයි.නිෂ්පාදන කර්මාන්ත හා උපයෝගිතා කර්මාන්ත (විදුලිය හා ජලය සැපයීම) යන අංශ වල මාසික මිල තොරතුරු කාර්තුමය වශයෙන් එකතු කරනු ලැබේ. බස්නාහිර, දකුණ, මධ්‍යම යන පළාත් හි පිහිටා තිබෙන නිෂ්පාදන කර්මාන්ත අංශයට අයත් ආයතන 375 ක තොරතුරු එක්රැස් කරනු ලබයි. ප්‍රථම වතාවට නිෂ්පාදකයාගේ මිල දර්ශකය 2015 දෙවන කාර්තුව සඳහා ප්‍රකාශයට පත් කරන ලදී.

**වගු අංක 6: නිෂ්පාදකයාගේ මිල දර්ශකයේ විචලනය (පදනම 2013** Q4=100)

| මාසය | දර්ශක අගය | |
|---|---|---|
| | **2014** | **2015** |
| ජනවාරි | 100.8 | 107.3 |
| පෙබරවාරි | 101.1 | 103.2 |
| මාර්තු | 100.5 | 101.9 |
| අප්‍රේල් | 102.3 | 102.9 |
| මැයි | 100.2 | 105.8 |
| ජූනි | 100.1 | 105.5 |
| ජූලි | 100.9 | 107.2* |
| අගෝස්තු | 104.5 | 105.3* |
| සැප්තැම්බර් | 101.2 | 105.8* |
| ඔක්තෝම්බර් | 103.5 | 106.0** |
| නොවැම්බර් | 102.0 | 106.3** |
| දෙසැම්බර් | 102.1 | 107.1** |

* සංශෝධිත ** යාවකාලිකයි

## 2.2.9 පළාත් පාලන සංඛ්‍යාති

දිවයිනේ සියලුම මහ නගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභා ඇතුලත් පළාත් පාලන ආයතනයන්හි ආදායම් වියදම් දත්ත සහ එමඟින් සපයන සේවාවන්, යටිතල පහසුකම් ඇතුලු පොදු තොරතුරු රැස්කිරීම සෑම වර්ෂයකදීම සිදු කරනු ලබයි. දිස්ත්‍රික් සංඛ්‍යාලේඛන අංශ හරහා පළාත් පාලන ආයතන මගින් ලබාගන්නා තොරතුරු විශ්ලේෂණය කර ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතය කාර්තුගතව ගණනය කිරීම සඳහා ජාතික ගිණුම් අංශයට ලබා දෙන අතර වාර්ෂිකව ප්‍රකාශයට පත් කරනු ලබන සංඛ්‍යාන නිබන්ධනය සහ සංඛ්‍යාන අත්පොතෙහි ද 2014 වර්ෂයට අදාළ පළාත් පාලන සංඛ්‍යාතීන් ඇතුලත් කර ඇත.

## 2.2.10 පර්යේෂණ හා විශේෂ අධ්‍යයන කටයුතු

### I. නිල සංඛ්‍යාති වැඩසටහන

නිල සංඛ්‍යාති වැඩසටහන මගින් රටේ විවිධ ආයතන සතු දත්ත උපයෝගීකරගෙන සකස් කළ හැකි දර්ශකාංක හදුනාගෙන එම දර්ශකාංක දත්ත පරිහරණය කරන්නන් වෙත විධිමත්ව ලබාදීම සඳහා අවශ්‍ය වැඩපිළිවෙලක් සකස් කිරීම සිදු කරයි. මෙම වැඩසටහන ජාතික දත්ත කමිටුවට අනුබද්ධ අනුකමිටු 22ක් හරහා සිදු කරනු ලබන අතර මෙහිදී එක් එක් විෂයයන්ට අදාල ප්‍රධාන ආයතන හදුනාගෙන එම ආයතන වල නියෝජිතයන්ගෙන් සැදුම්ලත් අනුකමිටු පිහිටුවා එම අනුකමිටු මගින් ක්ෂේත්‍රයට අදාල දර්ශකාංක හදුනාගෙන එම දර්ශකාංක සකස් කිරීමේ ක්‍රමවේදය, නිකුත් කරනු ලබන කාල පරාසය යනාදිය ඇතුලත් සම්පූර්ණ වාර්තාවක් සකස් කළ යුතු වේ. 2015 වර්ෂය අවසන් වන විට මෙම අනුකමිටු අතරින් 16 ක වැඩ සම්පූර්ණයෙන් නිම කර අවසන් වාර්තාව භාරදී ඇත. ඉතිරි අනුකමිටු වල කාර්යයන් තව දුරටත් සිදුකරමින් පවතී.

### II. MDG/SDG දර්ශකාංක සකස් කිරීම

එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් හඳුන්වා දෙන ලද සහශ්‍ර සංවර්ධන අභිමතාර්ථ (MDGs) වලට අදාල ඉලක්ක සපුරා ඇත්ද යන්න තහවුරු කිරීමට යොදාගනු ලබන දර්ශකාංක අතරින් 2015 වර්ෂයට අදාලව යාවත්කාලීන කළ හැකි සියලු දර්ශකාංක යාවත්කාලීන කිරීම් සිදුකර ඇත.

පශ්චාත් 2015 සංවර්ධන වැඩසටහන යටතේ එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් 2016 සිට 2030 දක්වා වන කාල පරිච්ඡේදය සඳහා තිරසාර සංවර්ධන අභිමතාර්ථ (SDGs) හඳුන්වා දෙන ලදී. මෙහිදී යෝජනා කරන ලද දර්ශකාංක පිළිබඳ අදහස් හා යෝජනා ශ්‍රී ලංකාව වෙනුවෙන් ලබා දෙන ලදී.

### III. ස්ත්‍රී පුරුෂ භාවය අනුව සංඛ්‍යාති සකස් කිරීම (Preparing Gender Statistics)

දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබන සංගණන හා සමීක්ෂණ තොරතුරු සහ අනෙකුත් මූලාශ්‍රවලින් ලබාගන්නා ලද ස්ත්‍රී පුරුෂ භාවය අනුව සංඛ්‍යාති භාවිතා කරමින් ළමා හා කාන්තා කටයුතු අමාත්‍යාංශයට අවශ්‍ය "The Sri Lankan Woman" ප්‍රකාශනය සකස් කිරීම අවසන් කර එම අමාත්‍යාංශයට භාරදෙන ලදී.

### IV. ජාතික තොරතුරු කමිටුවට අදාල රාජකාරී කටයුතු

රටේ දත්ත සපයනු ලබන ප්‍රධාන ආයතන තුනක් වන ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව, මහා භාණ්ඩාගාරය හා ජාතික තොරතුරු හා සන්නිවේදන තාක්ෂණායතනය සම්බන්ධ කර ගනිමින් කලට වේලාවට විශ්වාසනීය ආකාරයට දත්ත නිකුත් කිරීම තහවුරු කිරීම, දත්ත වල ද්විකරණය (duplication) වැලැක්වීම හා සියළු දෙනා සඳහා දත්ත විවෘත කිරීම පදනම් කර ගනිමින් 2015 වර්ෂයේදී ජාතික තොරතුරු කමිටුව ස්ථාපනය කරන ලදී. තොරතුරු කමිටු රැස්වීම් වලට සහභාගී වෙමින් මෙම කමිටුවේ කාර්යයන් සඳහා සහයෝගය ලබාදීම දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව සිදු කරන ලදී.

**V. සාර්ක් සංඛ්‍යාති සකස් කිරීම**

සාර්ක් සංවිධානයට අයත් රටවල් වල සංඛ්‍යාලේඛන ආයතන විසින් වාර්ෂිකව සාර්ක් මහලේකම් කාර්යාලය වෙත යැවිය යුතු SAARC in Figures, SAARC Statistical Year Book ප්‍රකාශන වල ශ්‍රී ලංකාවට අදාල සංඛ්‍යාති/දර්ශකාංක යාවත්කාලීන කර යවන ලදී. මීට අමතරව SAARC Expert Group, SAARC Catalogue of Publications, SAARC Manual, Statistical Systems යන වාර්තා ද සාර්ක් මහලේකම් කාර්යාලය වෙත යවන ලදී.

**VI. සාර්ක් සංඛ්‍යාලේඛන ආයතන ප්‍රධානීන්ගේ වාර්ෂික සමුළුව පැවැත්වීම**

සෑම වසරකට වරක්ම සාර්ක් සංවිධානයට අයත් රටවල් වල සංඛ්‍යාලේඛන ආයතන ප්‍රධානීන්ගේ සමුළුවක් සංවිධානය කරනු ලබන අතර 2015 වර්ෂයේ එහි සත්කාරක රට වූයේ ශ්‍රී ලංකාවයි. ඒ අනුව 2015 ජූලි මස 23 හා 24 දෙදින තුළ ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් මෙම සමුළුව කොළඹදී පවත්වන ලදී. මෙහිදී කලාපීය වශයෙන් වැදගත් තීරණ රැසකට එලැඹි අතර ඉදිරි වර්ෂය සඳහා කළාපීය සභාපතිත්වය ශ්‍රී ලංකාවේ ජනලේඛන හා සංඛ්‍යාලේඛන අධ්‍යක්ෂ ජනරාල් තුමා වෙත පිරිනමන ලදී.

**VII. ලෝක සංඛ්‍යාන දිනය නිමිත්තෙන් වැඩසටහන් සංවිධානය කිරීම**

එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් 2010 වර්ෂයේදී හඳුන්වා දෙන ලද ලෝක සංඛ්‍යාන දිනය සෑම වසර 5 කට වරක්ම යෙදෙන ඔක්තෝබර් මස 20 වන දින සෑම රටක් විසින්ම සමරනු ලැබේ. ඒ අනුව 2015 ඔක්තෝබර් 20 වන දින දෙවන ලෝක සංඛ්‍යාන දිනය යෙදී තිබුණු අතර ශ්‍රී ලංකාවේ නිල සංඛ්‍යාති සකස් කරනු ලබන ප්‍රමුඛතම ආයතනය වන ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් දෙවන ලෝක සංඛ්‍යාන දිනයේ තේමාව වන "නිවැරදි දත්ත තුළින් වඩා සරු දිවියක්" පදනම් කරගනිමින් පහත සඳහන් වැඩසටහන් පවත්වා මෙම දිනය උත්සවාකාරයෙන් සමරන ලදී.

- නිල සංඛ්‍යාති පිළිබඳව කොළඹ දිස්ත්‍රික්කයේ පාසල් සිසුන් දැනුවත් කිරීමේ සම්මන්ත්‍රණය
- දිවයිනේ සියලුම පාසල් වල සිසුන් දැනුවත් කිරීම පිණිස උදෑසන රැස්වීම අතරතුර දෙවන ලෝක සංඛ්‍යාන දිනයේ තේමාව වන "නිවැරදි දත්තවලින් වඩා සරු දිවියක්" යන්න පාදක කරගනිමින් කෙටි දේශනයක් පැවැත්වීම
- නිල සංඛ්‍යාති පිළිබඳව දිස්ත්‍රික්ක මට්ටමින් පවත්වන ලද දැනුවත් කිරීමේ සම්මන්ත්‍රණ
- නිල සංඛ්‍යාති භාවිතය පිළිබඳ ජන මාධ්‍යවේදීන්ගේ දැනුම වර්ධනය කිරීම සඳහා පවත්වන ලද වැඩමුළුව
- දෙපාර්තමේන්තුවේ කාර්යය භාරය, නිල සංඛ්‍යාතිවල වැදගත්කම මෙන්ම දෙපාර්තමේන්තුවට නිවැරැදි දත්ත ලබා දීමේ වැදගත්කම පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම සඳහා පවත්වන ලද රූපවාහිනී සාකච්ඡා
- ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ කාර්යය මණ්ඩලය වෙනුවෙන් පවත්වන ලද ලෝක සංඛ්‍යාන දින සැමරුම් වැඩසටහන
- 2015 ලෝක සංඛ්‍යාන දිනය සැමරීම පිණිස 2015.10.20 දින කොළඹදී පවත්වන ලද ජාතික වැඩසටහන

**VIII. විදේශීය ප්‍රශ්ණාවලින් සඳහා පිළිතුරු සැපයීම**

එක්සත් ජාතීන්ගේ සංවිධානයට අයත් ආයතන සහ අනෙකුත් ජාත්‍යන්තර සහ කලාපීය සංවිධාන මගින් එවනු ලබන ප්‍රශ්ණාවලි සඳහා පිළිතුරු සැපයීම මෙන්ම ජාත්‍යන්තර ආයතන වල දත්ත ඉල්ලීම් අනුව දෙපාර්තුමේන්තුව විසින් පිළියෙළ කරනු ලබන දත්ත මෙන්ම වෙනත් ආයතන වලින් ලබාගත යුතු දත්ත එම ආයතන වෙත ලබාදීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කෙරිණි. එමෙන්ම ජාත්‍යන්තර සංවිධාන/ආයතන මගින් සංඛ්‍යාලේඛන ක්ෂේත්‍රයට අදාල විවිධ ප්‍රකාශන සඳහා අදහස් විමසීම්, අර්ථ නිරූපන ඉල්ලීම් කරනු ලබන අවස්ථාවලදී අදාල දේශීය ආයතන සම්බන්ධීකරණය කරමින් එම අවශ්‍යතා ඉටු කිරීම ද දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව සිදු කරනලදී.

## 2.2.11 ව්‍යාපාර පිළිබඳ සංඛ්‍යාන නාමාවලිය( Statistical Business Register)

ව්‍යාපාර පිළිබඳ සංඛ්‍යාන නාමාවලිය(SBR) සකස් කිරීම සඳහා ප්‍රධාන පාර්ශවකරුවන් සමග සාකච්ඡා කර මේ සඳහා අවශ්‍ය විචල්‍යයන් හඳුනා ගැනීම සිදු කරන ලදී. එමෙන්ම දත්ත හුවමාරු කර ගැනීම සම්බන්ධව අවබෝධතා ගිවිසුමක් සකස් කිරීමට කටයුතු කිරීම සහ එහි අන්තර්ගතය පිළිබඳ මූලික සාකච්ඡා කරන ලදී.

ආසියානු සංවර්ධන බැංකු ව්‍යාපෘති කාර්යාලය මගින් ලබා දෙන ලද ව්‍යාපාර පිළිබඳ සංඛ්‍යාන නාමාවලිය(SBR) සඳහා වූ වැඩසටහන සඳහා සංශෝධන ඉදිරිපත් කිරීම සිදු කල අතර ව්‍යාපෘතිය ආරම්භ කිරීමට අවශ්‍ය මූලික උපාංග මිලදී ගැනීම සිදු කරන ලදී.

දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ බදු එක්රැස් කිරීමේ වැඩසටහන (RAMEX) උපයෝගී කරගෙන ව්‍යාපාර පිළිබඳ සංඛ්‍යාන නාමාවලිය(SBR) සඳහා දත්ත ලබා ගැනීම සම්බන්ධයෙන් සාකච්ඡා කරමින් පවතී.

ආර්ථික සංගණනයේ විස්තරාත්මක දත්ත රැස් කිරීමේ අදියර යටතේ ලැයිස්තු ගත කරන ලද ආර්ථික ඒකක පිළිබඳ විස්තර පරිගණක ගත කිරීම අවසන් කර ඇත.

## 2.2.12 ගොඩනැගිලි සංඛ්‍යාලේඛන

ශ්‍රී ලංකාවේ මහ නගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභා යන සෑම පලාත් පාලන බල ප්‍රදේශයක්ම ආවරණය වන පරිදි මාසිකව ගොඩනැගිලි සංඛ්‍යාලේඛන එක් රැස් කරනු ලැබේ. මෙම සංඛ්‍යාලේඛණ රැස් කරනු ලබන්නේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්ට අනුයුක්ත සංඛ්‍යාලේඛණ නිලධාරී හෝ සංඛ්‍යාලේඛණ සහකාර නිලධාරීන් විසිනි.

2015 ජූලි මාසය දක්වා ගොඩනැගිලි සංඛ්‍යාලේඛන රැස් කිරීම සඳහා භාවිතා කරන ලද BS/U/01 පෝරමයේ 1 කොටස මගින් ඒ ඒ මාසයට අදාලව අනුකූලතා සහතික නිකුත් කිරීම සම්බන්ධ තොරතුරු ලබා ගන්නා ලදී. ඒ යටතේ සාදා නිම කරන ලද නව ගොඩනැගිලි, අතිරේක කොටස් ගැනීම් හා වෙනස්කිරීම්හි නේවාසික හා නේවාසික නොවන ගොඩනැගිලි වල මහල් සංඛ්‍යාව බිම් ප්‍රමාණය හා ඇස්තමේන්තු වියදම් ලබා ගන්නා ලදී. තවද එම ගොඩනැගිලි වල ගෙබිම, බිත්ති හා වහල තනන ලද්දේ කෙබඳු ද්‍රව්‍යවලින්ද යන්නද වාර්තා ලබා ගන්නා ලදී. II වන කොටස මගින් ඒ ඒ මාසය තුල නිකුත් කරන ලද ගොඩනැගිලි බලපත්‍ර ගණන හා ඒ යටතේ වූ වර්ග ප්‍රමාණය පිළිබඳ තොරතුරුද ලබා ගන්නා ලදී.

2015 පෙබරවාරි මාසයේදී මෙතෙක් භාවිතා කරන ලද BS/U/01 ගොඩනැගිලි සංඛ්‍යාලේඛන එක් රැස් කිරීමේ පෝරමය BS/U/NEW ලෙස වැඩි දියුණු කරන ලද අතර එමගින් මෙතෙක් භාවිතා කළ BS/U/01 පෝරමයේ 01 කොටසින් එක් රැස් කළ තොරතුරු අතරින් ඇස්තමේන්තු වටිනාකම ඉවත් කළ අතර II

කොටසේ නිකුත් කරන ලද බලපත්‍ර පිළිබද වර්ගීකරණයෙන් "වෙනස් කිරීම් පමණක්" යන කොටස ඉවත් කර ඇත.

මාසිකව එක්රැස් කරනු ලබන ගොඩනැගිලි සංඛ්‍යාලේඛන වල නිරවද්‍යතාවය තහවුරු කර ගැනීම සඳහා සෑම මසකදීම දිස්ත්‍රික් සංඛ්‍යාලේඛනඥ මගින් එක් පළාත් පාලන ආයතනයක තොරතුරු රැස් කිරීම අධීක්ෂණය කිරීම සිදු කරනු ලබයි.

ගොඩනැගිලි සංඛ්‍යාලේඛන රැස් කිරීමේ නව ආකෘති පත්‍රය වන BS/U/NEW මගින් 2015 ජූලි මාසයේ සිට දත්ත රැස් කිරීම ක්ෂේත්‍රයේදී සිදු කරමින් පවතී.මෙතෙක් ලබා ගන්නා තොරතුරු විශ්ලේෂණය කිරීමෙන් සෑම වර්ෂයකදීම සංඛ්‍යාන නිබන්ධනය සඳහා අදාලවූ ගොඩනැඟිලි සංඛ්‍යාතීන් ලබා දෙනු ලැබේ.

### 2.2.13 කාර්මික නිෂ්පාදන දර්ශකය (IIP)

පර්යේෂණ මට්ටමින් කාර්මික නිෂ්පාදන දර්ශකයක් ගණනය කරන ලදී.

### 2.2.14 පුහුණු කටයුතු

සංඛ්‍යාන පුහුණු අංශය මඟින් 2015 වර්ෂය සඳහා පහත සඳහන් පුහුණු පාඨමාලා පවත්වා ඇත.

| පාඨමාලාවේ නම | පුහුණු වූ නිලධාරීන් සංඛ්‍යාව |
|---|---|
| 1. දෙමළ භාෂා පුහුණුව (III මට්ටමේ සිට I මට්ටම දක්වා) | 10 |
| 2. දෙමළ භාෂා පුහුණුව (III මට්ටම) | 116 |
| 3. දෙමළ භාෂා පුහුණුව (II මට්ටම) | 11 |
| 4. සිංහල භාෂා පුහුණුව | 15 |
| 5. නවක සංඛ්‍යාලේඛන නිලධාරි පුහුණුව | 25 |
| 6. SPSS | 38 |
| 7. STATA | 20 |
| 8. Desktop Publishing Basic and Tamil Typing | 13 |
| 9. Interview Techniques | 34 |
| 10. Basic Statistics | 24 |
| 11. විදේශ පාඨමාලාවකට සහභාගි වීමෙන් පසු පුහුණු සැසි පැවැත්වීම | 17 |
| 12. පරිගණක දෘඩාංග පුහුණුව | 18 |
| 13. ඉන්වෙන්ට්‍රි භාණ්ඩ සමීක්ෂණ කටයුතු | 39 |
| 14. කාර්යාලීය ලිපි ලේඛණ පිලියෙල කිරීම | 34 |
| 15. සං.සහකාර නිලධාරීන් සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාගය | 02 |
| 16. Access | 19 |
| 17. Basic Computer | 29 |
| 18. Data Collection Skills Development | 16 |
| 19. E-View Basic Econometrics | 13 |
| 20. පුහුණු වැඩමුලුව - යාපනය විශ්ව විද්‍යාලය | 40 |
| 21. නවක සංඛ්‍යාලේඛනඥ පුහුණු පාඨමාලාව | 20 |

## 2.2.15 තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කටයුතු

දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන සංගණන හා සමීක්ෂණවල දත්ත සැකසුම් කටයුතු ද ඇතැම් අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තුවලට අනුයුක්ත සංඛ්‍යාලේඛන අංශ වලට අයත් දත්ත සැකසුම් කටයුතුද තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශය මගින් සිදු කරන ලදී.

**I. ආර්ථික සංගණනය - 2013/14**
**(කර්මාන්ත හා කෘෂිකර්ම අංශ)**

කර්මාන්ත හා සේවා අංශයට අදාලව අවිධිමත් හා වෙළඳ අංශයන්හි දත්ත පරිගණකගත කිරීමට අදාල වැඩසටහන් සකස් කර ඇති අතර කර්මාන්ත අංශයේ දත්ත පරිගණක ගත කරමින් පවතී.

කෘෂිකර්ම අංශයට අදාලව කුඩා ගොවි කාණ්ඩ (SH2) සඳහා දත්ත පරිලෝකනය අවසන් කර ප්‍රතිබිම්බ වලින් දත්ත උකහා ගනිමින් පවතී. තවද ආහාර සුරක්ෂිතතා සමීක්ෂණයේ (FSQ) දත්ත පරිගණක ගත කරමින් පවතී. ග්‍රාමීය නිලධාරි කොට්ඨාශයන්ට අදාලව ඇති පහසුකම් පිළිබඳව රැස් කල දත්ත තොරතුරු පරිගණක ගත කිරීම අවසන් කර ඇති අතර වගු ආකෘතීන් ට අදාල පරිගණක වැඩසටහන් නිම කර ඇත.

**II. ශ්‍රම බල සමීක්ෂණය - 2014**

උක්ත සමීක්ෂණයට අදාලව දත්ත ගොනුව සකස් කිරීම අවසන් කොට ඇත.

**III. ශ්‍රී ලංකා රේගු දත්ත - 2015**

2015 ජනවාරි සිට නොවැම්බර් දක්වා මාස වල දත්ත ගොනු සැකසීම සහ ආදායම් සංඛ්‍යාතීන් සැකසීම අවසන් කර ඇත.

**IV. කම්කරු රැකියා සමීක්ෂණය - 2015**
**(Annual Employment Survey)**

කම්කරු දෙපාර්තමේන්තුවේ සංඛ්‍යාලේඛන අංශය මගින් වාර්ෂිකව සිදු කරනු ලබන උක්ත සමීක්ෂණයේ දත්ත ගොනුව පිලියෙල කිරීම අවසන් කොට ඇත.

**V. දෙපාර්තමේන්තු වෙබ් අඩවිය වැඩි දියුණු කිරීම**

2015 වර්ෂයට සැලසුම් කල දෙපාර්තමේන්තු වෙබ් අඩවිය වැඩි දියුණු කිරීමේ කටයුතු හා යාවත්කාලීන කිරීමේ කටයුතු අවසන් කරන ලදී.

**VI. කඩිනම් දත්ත වැඩ සටහන (Accelerated Data Programme) (ADP)**

ස්ථාපනය කරන ලද දත්ත පද්ධතිය වැඩි දියුණු කිරීමේ සහ යාවත්කාලීන කිරීමේ කටයුතු සැලසුම් මෙම වසර තුලදී ඉටු කරන ලදී.

**VII. Digital Display Unit**

දත්ත ප්‍රදර්ශනය කිරීමේ ඒකකයට අදාල නවතම දත්ත ඇතුලත් කරමින් යාවත්කාලීන කිරීමේ කටයුතු සිදු කර ඇත.

**VIII. "ලංකා සිස් "සංඛ්‍යාන තොරතුරු පද්ධතිය (Lanka SIS)**

"ලංකා සිස් "තොරතුරු පද්ධතිය වැඩි දියුණු කිරීමේ හා යාවත්කාලීන කිරීම මගින් දත්ත භාවිතා කරන්නන්ට ඉතා පහසුවෙන් දෙපාර්තමේන්තු දත්ත ලබා ගැනීමේ හැකියාව ලැබී ඇත.

**IX. VPN දත්ත පරිගණක ගත කිරීමේ ක්‍රමවේදය**

දිස්ත්‍රික්ක මට්ටමින් ලබාගන්නා දත්ත අදාළ අංශය වෙත කඩිනමින් ලබා ගැනීමේ ක්‍රම වේදය සඳහා VPN තාක්ෂණය දිස්ත්‍රික් කිහිපයක ස්ථාපිත කරන ලදී. මෙම VPN තාක්ෂණය යොදා ගනිමින් මිළ හා වේතන අංශය විසින් ගණනය කරනු ලබන CCPI හා PPI යන දර්ශකයන් සඳහා අවශ්‍ය දත්ත කඩිනමින් ලබා ගැනීම සිදු කරයි. එමෙන්ම වී අස්වැන්න ඇස්තමේන්තු කිරීම සඳහා ද මෙම තාක්ෂණය පරීක්ෂණාත්මක මට්ටමින් අත් හදා බලනු ලැබීය. මේ සඳහා අවශ්‍ය පරිගණක වැඩසටහන පිලියෙල කිරීම නිම කර ඇත.

**X. පරිගණක නඩත්තු කිරීම**

දෙපාර්තමේන්තුගත සියළුම පරිගණක වල තොරතුරු හා කාර්මික දෝෂ වලට පිලියම් යොදා එම පරිගණක යථා තත්වයට පත් කිරීමේ කටයුතු සිදු කරන ලදී.

## 2.2.16 ප්‍රකාශන කටයුතු

දෙපාර්තමේන්තුවේ ඉදිරි වර්ෂය සඳහා වූ ක්‍රියාකාරී සැලැස්ම, වාර්ෂික කාර්ය සාධන වාර්තාව, සංඛ්‍යාන නිබන්ධනය, සංඛ්‍යාන අත්පොත (ඉංග්‍රීසි, සිංහල/දෙමළ), දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍ර සටහන් පොත සැකසීම සහ දෙපාර්තමේන්තුවේ ප්‍රකාශන බෙදා හැරීම ප්‍රකාශන අංශයේ මූලික කාර්යයන් වේ.

ක්ෂේත්‍ර ගණනාවක වසර කිහිපයක් දත්ත ඇතුලත්ව සකස් කරනු ලබන සංඛ්‍යාන නිබන්ධනය 2015 හා සංඛ්‍යාන අත්පොත 2015 අදාල කාල පරිච්ඡේදයන් තුලදී දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ ප්‍රකාශයට පත්කල අතර මුද්‍රණය කොට බෙදා හරින ලදී.

දෙපාර්තමේන්තුවේ මෙහෙවර සාක්ෂාත් කර ගැනීම සඳහා 2016 වර්ෂය සඳහා වූ ක්‍රියාකාරී සැලැස්ම අනුමත ඇස්තමේන්තු යටතේ සකසන ලදී.දෙපාර්තමේන්තුවේ සියලුම අංශයන් හා දෙපාර්තමේන්තුවෙන් පරිබාහිරව අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වලට අනුයුක්ත සංඛ්‍යාලේඛන අංශයන් මගින් ඉටු කරන ලද කාර්යයන් හා අදාළ වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තාවද ඇතුලත් වාර්ෂික කාර්ය සාධන වාර්තාව 2014 ප්‍රකාශයට පත්කල අතර එම වාර්තාවේ සංයුක්ත තැටි 350 ක් පාර්ලිමේන්තුව වෙත යැවීමට කටයුතු කරන ලදී.

දෙපාර්තමේන්තුවේ කාලීන තොරතුරු ඇතුලත් සංඛ්‍යාන පුවත් විවරණිකාව 2015 අර්ධ වාර්ෂිකවද විවිධ ක්ෂේත්‍රයන් යටතේ සකසන ලද සංඛ්‍යාන දත්ත පත්‍රිකාව 2015 ත්‍රිත්ව භාෂාවෙන්ම මුද්‍රණය කර බෙදා හරින ලද අතර දෙපාර්තමේන්තු වෙබ් අඩවිය මඟින්ද ප්‍රකාශයට පත් කරන ලදී.

දෙපාර්තමේන්තුව මඟින් ප්‍රකාශයට පත් කරනු ලබන ප්‍රකාශනයන් සහ පුවත්පත් විවරණිකා සඳහා අදාළ වූ ISBN/ISSN අංක ලබා ගැනීමත් එකී ප්‍රකාශනයන් සඳහා මිළ ගනන් කැඳවීමේ කටයුතු ද අදාළ කාලය තුල ඉටු කරන ලදී.

එක් රැස් කරනු ලබන දත්ත ප්‍රචලිත කිරීමේ මූලික වගකීම දෙපාර්තමේන්තුව සතුවේ. මෙම කාර්යය සාක්ෂාත් කර ගැනීම සඳහා දෙපාර්තමේන්තුව මගින් ප්‍රකාශයට පත් කරනු ලබන ප්‍රකාශනයන්/පුවත් විවරණිකා ප්‍රමාදයකින් තොරව දේශීය/විදේශීය ආයතනයන් සහ පුද්ගලයන් අතර බෙදා හැරීම සිදු කරන ලදී.

මෙයට අමතරව ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය සඳහා වූ 2015 ප්‍රගතිය සහ 2016 සංවර්ධන සැලැස්ම වාර්තාව මුද්‍රණය සඳහා සූදානම් කිරීම හා මුද්‍රණ කටයුතු ඉටු කර දෙන ලදී.

## 2.2.17 මුද්‍රණ කටයුතු

දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන සංගණන හා සමීක්ෂණ සඳහා උපලේඛන, ප්‍රශ්නාවලීන්, උපදෙස් අත්පොත් මෙන්ම සංගණන හා සමීක්ෂණ වාර්තා දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලය මගින් මුද්‍රණය කිරීම සිදු කරන ලදී.

2015 වසර තුලදී පහත සඳහන් ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයේදී මුද්‍රණය කරන ලදී.

I. Key Finder (Sinhala/Tamil/English)
II. ශ්‍රී ලංකාවේ වැඩිහිටි ජනගහනය
III. Population Table
IV. Housing Table
V. Survey of Construction(Final Report)
VI. SLSIC ප්‍රකාශනය
VII. කර්මාන්ත සංගණනය S 2(සිංහල/දෙමළ/ඉංග්‍රීසි)
VIII. ASI Report
IX. Report of Listing Stage
X. කුඩා ගොවි කාණ්ඩ අවසන් වාර්තාව
XI. National Accounts
XII. Nationl Accounts of Sri Lanka
XIII. ජාතික ගිණුම් අවසන් වාර්තාව
XIV. ක්‍රියාකාරී සැලැස්ම - 2015
XV. කාර්ය සාධන වාර්තාව -2014
XVI. Statistical Newsletter ($1^{st}$ and $2^{nd}$ Issue)
XVII. සංඛ්‍යාන අත්පොත (සිංහල/දෙමළ)
XVIII. සංඛ්‍යාන දත්ත පත්‍රිකාව(සිංහල/දෙමළ/ඉංග්‍රීසි)
XIX. Statistical Pocket Book (English)
XX. Labour Force Quarterly Report($1^{st}$ Q,$2^{nd}$Q,$3^{rd}$ Q,$4^{th}$ Q) - 2014
XXI. Computer Literacy Survey 2014
XXII. Computer Literacy Bulletin 2014
XXIII. HIES අවසන් වාර්තාව
XXIV. Poverty Indicator
XXV. පරිගණක සාක්ෂරතා දත්ත ප්‍රකාශය
XXVI. Estimated Extend of Potato
XXVII. Labour Force Annual Report 2014
XXVIII. Computer Literacy 2015
XXIX. ශ්‍රම බල සමීක්ෂණ වාර්තා (සිංහල/දෙමළ)
XXX. ආහාර පරිභෝජන පත්‍ර සාරාංශය (සිංහල/දෙමළ)
XXXI. නේවාසිකයින් පිළිබඳ තොරතුරු පත්‍රය(සිංහල/දෙමළ)
XXXII. ලෝක සංගණන දින පණිවුඩය
XXXIII. ලෝක සංගණන දින සැමරුම
XXXIV. Web Blucher
XXXV. Bulletin of Retail Prices 2013
XXXVI. Weekly Retail Prices Colombo District
XXXVII. Retail and Producer Prices

### 2.2.18 සිතියම් විද්‍යා කටයුතු

ජන හා නිවාස සංගණනය - 2012 සඳහා භාවිතා කළ ග්‍රාම නිලධාරි කොට්ඨාශ සිතියම් අංකිත කිරීමේ කටයුතු සිදු කෙරෙමින් පවතින අතර මේ වන විට ගාල්ල, මාතර, හම්බන්තොට සහ මන්නාරම යන දිස්ත්‍රික්ක වලට අයත් ග්‍රාම නිලධාරි වසම් වල සිතියම් අංකිත කිරීම අවසන් කර ඇත. යාපනය දිස්ත්‍රික්කයට අයත් ග්රාම නිලධාරි වසම් සිතියම් වලින් 60%, වව්නියාව සහ කිලිනොච්චි දිස්ත්‍රික්ක වල ග්‍රාම නිලධාරි

වසම් සිතියම් වලින් 50% ක් අංකිත කිරීම මූලික අදියරේදී අවසන් කර ඇත. තවද, ජන හා නිවාස සංගණනය 2021 සඳහා සංගණන සිතියම් සකස් කිරීමේ ක්‍රමවේදය සම්බන්ධයෙන් පුහුණු කිරීමේ කටයුතු සඳහා අවශ්‍ය උපදෙස් සකස් කිරීමේ මූලික කටයුතු සිදු කෙරේ.

තවද, රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ ඒ සම්බන්ධ ආයතන වල ඉල්ලීම් මත අදාල සිතියම් සකස් කිරීමේ කටයුතු සිදු කර ඇත. කාලීනව සිදුවනු ලබන වෙනස් වීම් වලට අනුව MRCB දත්ත පද්ධතිය ද යාවත්කාලීන කිරීම අඛණ්ඩව සිදු කරනු ලැබේ.

## 2.2.19 දත්ත නිකුත් කිරීමේ කටයුතු

### I. ක්ෂුද්‍ර දත්ත නිකුත් කිරීම

දෙපාර්තමේන්තුවේ ක්ෂුද්‍ර දත්ත ගොනු බෙදා හැරීමේ ප්‍රතිපත්තිය (Dissemination Policy on Micro Data) අනුව 2015 වර්ෂය තුළදී මෙම ඒකකය මගින් 100% දත්ත ගොනු 64ක් නොමිලයේද 5ක් මුදල් අයකිරීම මතද දත්ත භාවිතා කරන්නන් වෙත නිකුත් කරන ලදී.

### II. පාර්ලිමේන්තු ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීම

ශ්‍රී ලංකා ජනරජයේ පාර්ලිමේන්තුවෙහි ගරු මැති ඇමතිවරුන්ගේ වාචික ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීමට අවශ්‍ය වන දත්ත හා තොරතුරු ලබා ගැනීම සඳහා අධ්‍යක්ෂ ජනරාල් වෙත එවනු ලබන ඉල්ලීම් සඳහා දත්ත ලබා දීම සිදු කරනු ලබයි. අදාල පාර්ලිමේන්තු ප්‍රශ්නයට අනුව දෙපාර්තමේන්තුවේ විවිධ අංශ සම්බන්ධීකරණය කරගනිමින් අදාල පිළිතුරු ත්‍රෛභාෂිකව සකසා මුදල් අමාත්‍යාංශයේ පාර්ලිමේන්තු කටයුතු දෙපාර්තමේන්තුව වෙත කඩිනමින් ලබාදීම මෙහිදී සිදුකරනු ලැබේ. මෙවැනි ඉල්ලීම් 03 ක් 2015 වර්ෂයේ ලැබුණු අතර එම සියල්ලටම පිළිතුරු ලබා දීමට කටයුතු කරන ලදී.

### III. වෙනත් ආයතන වල දත්ත ඉල්ලීම් සඳහා තොරතුරු ලබාදීම

අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කරනු ලබන විවිධ අමාත්‍යාංශ,දෙපාර්තමේන්තු අනෙකුත් රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන සහ පුද්ගලයින් විසින් කරනු ලබන දත්ත ඉල්ලීම් සඳහා අදාල තොරතුරු සැපයීම සිදු කරනු ලබයි. මෙම වර්ෂය තුලදී සාමාන්‍ය තැපැල මගින් හා විද්‍යුත් තැපැල මඟින් ලද දත්ත ඉල්ලීම් 310 කට පමණ තොරතුරු සැපයීම සිදු කර ඇත.

### IV. දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩල දත්ත පද්ධතිය පවත්වාගෙන යාම

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ, කාර්ය මණ්ඩල දත්ත පද්ධතිය පවත්වාගෙන යාම හා ඉහළ කළමනාකරණයේ අවශ්‍යතාවයන් සඳහා කාර්ය මණ්ඩල තොරතුරු ලබා දීම සිදුකරනු ලබයි. පාලන අංශය මඟින් ලබා දෙන තොරතුරු අනුව හා අදාල නිලධාරීන්ගෙන් ගෙන්වා ගන්නා ලද තොරතුරුද භාවිතයෙන් මෙම දත්ත පද්ධතිය 2015 වර්ෂයේ යාවත්කාලීන කරන ලදී.

### V. දෙපාර්තමේන්තු ප්‍රකාශන අලෙවි කවුළුව පවත්වාගෙන යාම

දෙපාර්තමේන්තුව මගින් ප්‍රකාශයට පත් කරනු ලබන මුද්‍රිත ප්‍රකාශන අලෙවිය මෙම ඒකකයෙහි පිහිටුවා ඇති අලෙවි කවුළුව මගින් සිදු කෙරේ. තවද 2015 ඔක්තෝබර් 20 දිනට යෙදුණු ලෝක සංඛ්‍යාන දින වැඩසටහන් සඳහාද කොළඹදී පැවැති සාර්ක් (SAARC) සංඛ්‍යාන සමුළුව සඳහා සහ 2015 දෙසැම්බර් මස ගාලු කොටුවෙහි පැවැත්වූ "ගාලු සමය" ප්‍රදර්ශන භූමියෙහිද දෙපාර්තමේන්තු ප්‍රකාශන අලෙවි කවුළුවක් පැවැත්වීම කරන ලදී. 2015 වර්ෂයේදී ප්‍රකාශන 603 ක් අලෙවි කර ඇත.

## 2.2.20 පුස්තකාල සේවා

දෙපාර්තමේන්තු පුස්තකාලය විමර්ශන අංශය හා බැහැරව දීමේ අංශය වශයෙන් කොටස් 2 කින් සමන්විතය.

දෙපාර්තමේන්තු නිලධාරීන්ට මෙන් ම බාහිර පාඨකයන් සඳහා ද විමර්ශන අංශය විවෘතව ඇති අතර දෙපාර්තමේන්තුවට අදාළ පැරණි සහ නව ප්‍රකාශන සහ ශ්‍රී ලංකා ග්‍රන්ථ එකතුව මෙයට අයත්වේ. මෙම ප්‍රකාශන විමර්ශනය සඳහා පමණක් වෙන් කර ඇත. ඊට අමතරව දෙපාර්තමේන්තු පුස්තකාලයේ නොමැති ප්‍රකාශන වෙනත් පුස්තකාල වලින් අන්තර් පුස්තකාල පිරුළු සේවය යටතේ ලබා දීමේ සේවාවද ක්‍රියාත්මක වේ.

බැහැරදීම් අංශයේ දෙපාර්තමේන්තු ප්‍රකාශනවලට අමතරව විවිධ විෂයයන්ට අදාළ එනම්, සංඛ්‍යානය, සිතියම් විද්‍යාව, ප්‍රජා විද්‍යාව, පරිගණක විද්‍යාව, ආර්ථික විද්‍යාව, සමාජ විද්‍යාව, කළමනාකරණය, ගණිතය, පුස්තකාල විද්‍යාව යනාදී විෂයය ග්‍රන්ථ මෙන්ම සාමාන්‍ය කියවීම් සඳහා උචිත ආගමික හා විවිධ සාහිත්‍ය කෘති (නව කතා, කෙටි කතා, පරිවර්තන) ඇති අතර දෙපාර්තමේන්තු නිලධාරීන් සඳහා පමණක් බාහිර පරිශීලනයට නිකුත් කරනු ලැබේ.

### I. පුස්තකාල පොත් සංඛ්‍යාංකකරණය

අන්තර්ජාලය පදනම් කරගත් පුස්තකාල ස්වයංකරණ සූචිය (Web Based Automated Library Catalogue System) ව්‍යාපෘතිය යටතේ පුස්තකාල පොත් දත්ත පදනමට ඇතුළත් කර ඇත. මේ සඳහා විවෘත මෘදුකාංගයක් වන KOHA භාවිත කරනු ලැබේ.

ජාතික විද්‍යා පදනම් ආයතනය මගින් ක්‍රියාත්මක ''ජාතික සංඛ්‍යාංකකරණ ව්‍යාපෘතිය'' සඳහා දෙපාර්තමේන්තු පුස්තකාලය ද තෝරා ගෙන ඇති අතර එමගින් දෙපාර්තමේන්තුව මගින් ප්‍රකාශිත පැරණි සහ දුර්ලභ ප්‍රකාශන (Blue Books) සංඛ්‍යාංකකරණය කර (Digitize) දත්ත පදනමකට ඇතුළත් කරමින් පවතී.

### II. පොත් මිලදී ගැනීම

දෙපාර්තමේන්තු නිලධාරීන් ගෙන් ලබා ගත් පොත් ලැයිස්තු හා පුස්තකාලයාධිපතින් විසින් තෝරා ගත් පොත් ලැයිස්තු ප්‍රකාශන ආයතන වෙත ගොස් තෝරා මිලදී ගැනීමේ කටයුතු මේ වන විට සිදු කරමින් පවතී.

### III. පුවත්පත් අංශය

පුස්තකාලයට ලබා ගන්නා සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂාවලින් ප්‍රකාශිත පුවත්පත් දෛනිකව ලබා ගැනීම සහ දෙපාර්තමේන්තුව මගින් ප්‍රකාශිත හා දෙපාර්තමේන්තුවට අදාල පුවත් උපුටන අදාල අංශ වෙත නිකුත් කරන ලදී.

### IV. ව්‍යාප්ති සේවා

පුස්තකාලයට ලැබෙන නව ප්‍රකාශන පිළිබඳ දෙපාර්තමේන්තු නිලධාරීන් දැනුවත් කිරීම සඳහා ''පටුන පිටු සේවය''(Content Page Service) ආරම්භ කරන ලදී. මෙය මාස 3 කට වරක් නිකුත් කරනු ලබන අතර විද්‍යුත් තැපැල මගින් නිලධාරීන් දැනුවත් කරනු ලැබේ.

ලෝක සංඛ්‍යාන දිනය සහ සාර්ක් සංඛ්‍යාන දිනය සඳහා දෙපාර්තමේන්තු පුස්තකාලය හා එහි එකතුව සේවා පිලිබඳ ඉදිරිපත් කිරීම් (Power Point Presentation) කරන ලදී.

### 2.2.21 ක්ෂේත්‍ර කළමණාකරණ කටයුතු

දිස්ත්‍රික් සංඛ්‍යාලේඛන අංශ හා ප්‍රධාන කාර්යාලය අතර සම්බන්ධීකරණ කටයුතු මනාව පවත්වා ගෙන යමින් ඒ ඒ අංශයන්ට අදාළ වූ විවිධ ප්‍රතිපාදන, භෞතික සම්පත් සපයා දීම මේ යටතේ සිදු කෙරේ. ඒ අනුව කාර්තුමය වශයෙන් දිස්ත්‍රික් සංඛ්‍යාලේඛන අංශ ප්‍රධානීන්ගේ හා ක්ෂේත්‍ර නිලධාරීන්ගේ මාසික ගමන් වියදම්, තැපැල් හා සන්නිවේදන ලිපිද්‍රව්‍ය, ඉන්ධන සඳහා ප්‍රතිපාදන, රියැදුරු බටා, අතිකාල දීමනා සහ විදුලිය, ජලය, සනීපාරක්ෂක කටයුතු වැනි කාර්යාලීය අවශ්‍යතා සඳහා අවශ්‍ය ප්‍රතිපාදන යැවීම සිදු කෙරේ.

දිස්ත්‍රික් සංඛ්‍යාලේඛන අංශ ප්‍රධානීන්ගේ වාර්ෂික වැඩමුළුව 2015.09.07 සහ 08 දෙදින තුල හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු ආයතනයේදී පවත්වන ලදී. අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ පළාත් සභාවල පිහිටුවා ඇති සංඛ්‍යාලේඛන අංශ වල රාජකාරි කටයුතු විමර්ශනය කිරීම, ප්‍රගතිය, ගැටළු හා විසඳුම් යෝජනා සාකච්ඡා කිරීම ප්‍රජා විද්‍යාත්මක, කෘෂිකාර්මික හා කර්මාන්ත කමිටු රැස්වීම් පැවැත්වීම මගින් සිදු කරන ලදී.

හොඳම දිස්ත්‍රික් කාර්යාලය තෝරීමේ ක්‍රමවේදය පිළිබඳ සවිස්තර ඉදිරිපත් කිරීමක් (presentation) දිස්ත්‍රික් සංඛ්‍යාලේඛන අංශ ප්‍රධානීන් වෙත දිස්ත්‍රික් ප්‍රධානීන්ගේ වැඩමුළුවේදී සිදු කරන ලද අතර ඔවුන්ගේ අදහස් හා යෝජනා ලබා ගැනීම සිදු කරන ලදී.

ක්ෂේත්‍ර නිලධාරීන්ගේ කාර්යක්ෂමතාවය සහ හැකියා ප්‍රවර්ධනය කිරීමේ තෙදින වැඩමුළු දෙකක් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේදී නිලධාරීන් 89 දෙනෙකුගේ සහභාගිත්වයෙන් 2015.05.13 , 14 හා 15 සහ 2015.09.02, 03 සහ 04 යන දිනයන්හි දී පවත්වන ලදී.

## 2.3 අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල ස්ථාපිත කර ඇති සංඛ්‍යාලේඛන ශාඛා කාර්යාල මගින් පවත්වනු ලබන සංගණන සහ සමීක්ෂණ

### 2.3.1 වාර්ෂික රැකීරක්ෂා සමීක්ෂණය

මෙමගින් දිවයිනේ පිහිටි පෞද්ගලික හා රාජ්‍ය යන දෙඅංශයෙහි සේවක අර්ථසාධක අරමුදලට දායකවන ව්‍යාපාර සහ සේවා ආයතන සම්බන්ධව වසරේ ජුනි මස අවසන් වැඩ කරන දිනය පදනම්ව තොරතුරු , ස්ථර අනුව ප්‍රමාණයට සමානුපාතිකව තෝරාගත් නියැදියක් ඇසුරින් තැපැල් මගින් වාර්ෂිකව තොරතුරු රැස් කිරීම සිදු කරනු ලැබේ. මෙම වාර්තාව මගින් දිවයිනෙහි සංවිධානය වූ සේවා නියුක්තිය, කර්මාන්ත හා වෘත්තීය වර්ගීකරණ තොරතුරු ඇතුළුව කම්කරු ක්ෂේත්‍රට අදාළ තවත් තොරතුරු රැසක් වාර්ෂිකව පවත්වනු ලබන " Annual Employment Survey " ප්‍රකාශනය මගින් වාර්ෂිකව ප්‍රකාශයට පත් කරනු ලැබේ.

### 2.3.2 සාමාන්‍ය ඉපැයීම් සහ වැඩ කල පැය ගණන පිළිබඳ සමීක්ෂණය

මෙම සමීක්ෂණය මගින් පඩි පාලක සභා ආඥා පනත යටතේ වේතන ලබන ආයතනවල පවතින සේවා තත්ත්ව අනුව සේවකයින්ගේ ඉපැයීම් වල වෙනස්වීමේ ආකාරය අධ්‍යයනය කරනු ලබයි. මෙහිදී පඩිපාලක සභා අනුව තෝරාගත් ආයතන වලින් සෑම වසරකම මාර්තු සහ සැප්තැම්බර් මාස වලදී වර්ෂයකට දෙවරක් තැපැල් මාර්ගිකව තොරතුරු රැස්කරනු ලබයි. එක් එක් සේවා තත්ත්ව අනුව ඉපැයීම් පිලිබද තොරතුරු රැස් කර වාර්ෂිකව ප්‍රකාශයට පත්කරනු ලබන " The Survey on hours of actually worked and average earings " ප්‍රකාශණය මගින් ප්‍රකාශයට පත් කරනු ලබන අතර එමගින් සේවා තත්ව අනුව ඉපැයීම් රටාව විග්‍රහ කරනු ලැබේ.

## 2.3.3 පඩිපාලක සහා අවම වැටුප් දර්ශකාංකය ගණනය කිරීම

පඩි පාලක සභා ආඥා පනත යටතේ කම්කරු දෙපාර්තමේන්තුව මගින් පඩි පාලක සභා අනුව නියම කරනු ලබන අවම වැටුප් පදනම් කොට මාසිකව අවම වැටුප් අනුපාත දර්ශකාංකය ගණනය කරනු ලැබේ. මෙම දර්ශකාංකය කෘෂි (වැවිලි අංශය) කර්මාන්ත, වාණිජ, සේවා යන ප්‍රධාන අංශ සඳහා වෙන් වෙන්ව හා ඒකාබද්ධව ගණනය කරනු ලබන අතර එමගින් ආර්ථිකයේ ප්‍රධාන අංශ වල අවම වැටුප් මට්ටම්වල වෙනස් නිරීක්ෂණය කරනු ලැබේ. ඉහත දර්ශකය, ශ්‍රී ලංකා මහ බැංකුව, ජන ලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව සහ ජාත්‍යන්තර කම්කරු සංවිධානය ඇතුළු විවිධ ආයතන වලට මාසිකව, කාර්තුමය සහ වාර්ෂිකව ලබාදෙනු ඇත.

## 2.3.4 කම්කරු සංඛ්‍යාති ප්‍රකාශනය ප්‍රකාශයට පත් කිරීම

දේශීය දත්ත ප්‍රයෝජනයට ගන්නන් සඳහා ශ්‍රී ලංකාවේ ශ්‍රම වෙළඳ පොල ආශ්‍රිත කම්කරු සංඛ්‍යාතීන් හා ඒ සමග සහ සම්බන්ධ වූ ජනගහනය හා ප්‍රජා විද්‍යාත්මක තොරතුරු සහ ශ්‍රම බලකාය, මිල, වැටුප් හා ආදායම් වියදම් සම්බන්ධව සාමාන්‍ය සමාජ ආර්ථික සහ කම්කරු සම්බන්ධතා, කම්කරු ආඥා පනත් ක්‍රියාත්මක කිරීම පිළිබඳව තොරතුරු අඩංගු " කම්කරු සංඛ්‍යාති" ප්‍රකාශනය වාර්ෂිකව ප්‍රකාශයට පත් කරනු ලබයි.මේ සඳහා අවශ්‍ය තොරතුරු විවිධ දෙපාර්තමේන්තු සහ ආයතන වලින් එක්රැස් කර ගනු ලැබේ.

දිවයිනේ සියලු කම්කරු කාර්යාල වලින් කම්කරු අණ පනත් ඇසුරින් සිදුකරනු ලබන කම්කරු සුපරීක්ෂණ මාසික වාර්තා පෝරම 14 ක් මගින් ලබා ගන්නා තොරතුරු සහ සේවක අර්ථසාධක අරමුදලට දායක වන නව ආයතන ශ්‍රී ලංකා සම්මත කර්මාන්ත වර්ගීකරණය (Sri Lanka Standard Industry Classification) මත CSpro දත්ත පද්ධතියක් වෙත ඇතුලත් කර තොරතුරු යාවත්කාලීන කිරීමසිදු කරන ලදී.

## 2.3.5 අධ්‍යාපන සංඛ්‍යාති

අධ්‍යාපන අමාත්‍යාංශයේ ස්ථාපිත කොට ඇති සංඛ්‍යාලේඛන ශාඛාව මගින් වාර්ෂිකව සිදුකරනු ලබන රජයේ පාසල් සංගණනයට සමගාමීව පුද්ගලික පාසල්, පිරිවෙන්, ගුරු අභ්‍යාස විද්‍යාල හා අධ්‍යාපන විද්‍යාපීඨ පිළිබඳව ද 2015 වර්ෂයට අදාළ ව දත්ත හා තොරතුරු රැස් කරන ලදි.

2015 ජූලි මස ආරම්භ කරන ලද එම පාසල් සංගණන කටයුතු දෙසැම්බර් මස වනවිට අවසන් වූ අතර මේ වනවිට එහි අවසන් දත්ත පාදකය සකස් කරමින් පවති. අවසන් දත්ත පාදකය සකස් කිරීමෙන් අනතුරුව 2016 මුල් කාර්තුව වන විට එම දත්ත හා තොරතුරු ලබාදීමට අපේක්ෂා කෙරේ.

2014 වර්ෂයේදී සිදු කරන ලද වාර්ෂික පාසල් සංගණනයේ අවසන් දත්ත පාදකය සකස් කොට එමගින් අනාවරණය වූ සියළු දත්ත හා තොරතුරු, විවිධ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, ආයතන හා වෙනත් දත්ත භාවිතා කරන්නන් වෙත ලබාදී ඇත.

මීට අමතරව දිවයිනේ පිහිටි සියළුම රජයේ පාසල්, පිරිවෙන්, පෞද්ගලික පාසල්, ගුරු අභ්‍යාස විද්‍යාල හා අධ්‍යාපන විද්‍යාපීඨ පිළිබඳ හා නොවිධිමත් අධ්‍යාපනය පිළිබඳ ආයතන ලැයිස්තු යාවත්කාලීන කොට පවත්වාගෙන යාමට කටයුතු කර ඇත.

## 2.3.6 වෛද්‍ය සංඛ්‍යාති

වෛද්‍ය සංඛ්‍යාලේඛන අංශය මගින් රට පුරා විසිරී ඇති රජයේ රෝහල් පද්ධතිය මගින්, අභ්‍යන්තර රෝගී හා මරණ, රෝගී ඇඳන් , සායන , බාහිර රෝගීන්, මාතෘ හා ළමා, මානව සම්පත්, විශේෂඥ වෛද්‍යවරුන් හා

දන්ත වෛද්‍ය සේවා යන ක්ෂේත්‍රයන් පිළිබඳව දත්ත රැස් කරන අතර අදාල ආකෘති පත්‍ර එම ආයතන වෙත නිකුත් කර, සම්පූර්ණ කරන ලද ආකෘති පත්‍ර නියමිත කාලයේදී ලබා ගනී.

2015 හි අවසාන කාර්තුවට අදාලව අභ්‍යන්තර රෝගීන් පිළිබඳ දත්ත හා බාහිර රෝගීන් පිළිබඳ දත්ත ලැබෙමින් පවතින අතර මාසිකව ලැබෙන මාතෘ හා ළමා සංඛ්‍යාති ලැබීම් සතුටුදායකය. 2015.12.31 ට අදාලව රැස් කරන මානව සම්පත්, විශේෂඥ වෛද්‍ය හා රෝගී ඇඳන් සංඛ්‍යාලේඛන ලැබෙමින් පවතී.

මෙම වර්ෂයේදී දත්ත විශ්ලේෂණය 2011, 2013 හා 2014 යන වසර 3 ටම අදාලව සිදු කිරීමට අංශයට සිදු වූ අතර 2011 හා 2013 දත්ත විශ්ලේෂණය අවසන් කළ අතර 2014 හි දත්ත ගොනු වල නිරවද්‍යතාවය පරීක්ෂා කරමින් පවතී. එයට සමගාමීව දත්ත පරිගණක ගත කිරීම සඳහා කාර්යක්ෂම වැඩ පිළිවෙලක් යෙදූ අතර මෙම වර්ෂය තුලදී , 2014 වර්ෂයේ දත්ත පරිගණක ගත කර අවසන් කර 2015 වර්ෂයේ දත්ත වලින් ද 30% ක් පමණ පරිගණක ගත කර අවසන් කරන ලදී.

2010 වර්ෂයේදී හඳුන්වා දුන් eIMMR ව්‍යාපෘතිය 2012 වර්ෂයේදී රෝහල්වල ස්ථාපනය කිරීම ආරම්භ කළ අතර 2013 වර්ෂයේදී රෝහල් 98 ක සාර්ථකව ස්ථාපනය කිරීමට හැකි විය. එමෙන්ම, 2014 වර්ෂයේදී අළුතින් රෝහල් 75 ක්ද, 2015 වර්ෂයේදී අළුතින් රෝහල් 127 ක්ද ඇතුලත් වූ අතර දැනට මෙම ව්‍යාපෘතිය රට පුරා රෝහල් 300 ක ක්‍රියාත්මක වේ .

2015 වර්ෂය සඳහා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල මට්ටමින් ජනගහන ඇස්තමේන්තු සකස් කර ප්‍රකාශයට පත් කරන ලදී. මේ සඳහා ජන හා නිවාස සංගණනය 2012 හි 5% නියැදියේ ග්‍රාම නිලධාරී කොට්ඨාශ ජනගහනය පාදක කර ගනු ලැබින. 2016 ජනගහන ඇස්තමේන්තුව පිළියෙල කිරීමට අවශ්‍ය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල ලැයිස්තුව යාවත්කාලීන කර ඇති අතර ජන හා නිවාස සංගණනය 2012 හි අවසන් වාර්තාවෙන් ජනගහනය පාදක කර ගෙන ජනගහනයේ ඇස්තමේන්තුව සැකසීමට සැලසුම් කර ඇත.

2009, 2010 වර්ෂයන්ට අදාළ වාර්ෂික සෞඛ්‍ය සංඛ්‍යාලේඛන වාර්තාව (Annual Health Statistics) හා 2013 වර්ෂයට අදාළ වාර්ෂික සෞඛ්‍ය සංග්‍රහය (Annual Health Bulletin) සකස් කර ප්‍රකාශයට පත් කරන ලද අතර, 2011 වර්ෂයට අදාළ වාර්තාවේ නිරවද්‍යතාවය පරීක්ෂා කරමින් පවතී.

### 2.3.7 ජීව සංඛ්‍යාති

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ සංඛ්‍යාලේඛන අංශය මගින් ශ්‍රී ලංකාවේ වාර්ෂිකව ලියාපදිංචි කරනු ලබන උපත්, විවාහ හා මරණ සංඛ්‍යාව හා ඊට අදාල ප්‍රජා විද්‍යාත්මක තොරතුරු හා මරණයට හේතු යන දත්ත රැස් කොට එම තොරතුරු වාර්තා මගින් ප්‍රකාශයට පත් කිරීම සිදු කරනු ලබයි.මේ වන විට 2011, 2012, 2013 වසර සඳහා මරණ වලට අදාල යාවත්කාලීන දත්ත ප්‍රකාශයට පත් කොට ඇති අතර එම වර්ෂයන්ට අදාල දත්ත පරිගණක ගත කිරීම අවසන් කර ඇත. 2014 සහ 2015 වසර වලට අදාල ප්‍රජාවිද්‍යාත්මක දත්ත මේ වන විට දිස්ත්‍රික් කාර්යාල වලින් ලැබෙමින් පවතී.

මීට අමතරව මධ්‍ය වාර්ෂික ජනගහනය ඇස්තමේන්තු කිරීමේ කටයුතු මෙම අංශය මගින් සිදු කෙරෙන අතර 2015 වර්ෂය සඳහා වයස් කාණ්ඩ සහ දිස්ත්‍රික් අනුව මධ්‍ය වාර්ෂික ජනගහනය සකස් කර දත්ත භාවිතා කරන්නන්ට ලබා දී ඇත. 2014 වර්ෂයට අදාල ජීව සංඛ්‍යාති දර්ශක (උදා : දළ උපත් අනුපාතිකය, දළ මරණ අනුපාතිකය, ජනගහන වර්ධන අනුපාතිකය ආදිය) සකස් කිරීම අවසන් කර ඇත.

### 2.3.8 රේගු සංඛ්‍යාති

ශ්‍රී ලංකා රේගුවේ ස්වයංක්‍රීය දත්ත සැකසුම් අංශයෙන් පරිගණක ගත කරන ලද ආනයන/අපනයන සම්බන්ධ දත්ත දිනපතාම ලබා ගැනීමත් බාහිර වෙළඳ සංඛ්‍යාති වලට අදාල තොරතුරු සකස් කිරීමත් ආනයන/අපනයන හා ප්‍රති අපනයන ලෙස දත්ත වෙන්කර ගොනු සකස් කිරීමත් දෝෂ සහිත දත්ත නිවැරදි කරමින් මාසික දෝෂ රහිත පරිගණක දත්ත ගොනු සකස් කිරීම හා සංඛ්‍යාන දත්ත අලෙවි අංශය

කාර්යක්ෂමව පවත්වාගෙන යාමත් වගකීම් දරන ප්‍රධාන ක්ෂේත්‍ර වේ. බාහිර වෙළඳ සංඛ්‍යාති අදාල මාසය අවසන්ව දින 15 ක කාලය තුලදී මාසිකව සකස් කර ශ්‍රී ලංකා මහ බැංකුවට,මහ භාණ්ඩාගාරයට, ජාතික ගිණුම් සකස් කිරීම සඳහා ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවට,විවිධ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වලට ,දේශීය හා විදේශීය ආයතන වලට, තානාපති කාර්යාල වලට හා පර්යේෂකයන්ට නිකුත් කර ඇත.

### 2.3.9 ධීවර සංඛ්‍යාති

වෙරළාශ්‍රිත හා ගැඹුරු මුහුදේ මත්ස්‍ය නිෂ්පාදනය, තොග සහ සිල්ලර මත්ස්‍ය මිල ගණන් සහ මත්ස්‍ය නිෂ්පාදනය සහ ආනයනය අපනයනය දත්තයන් එක්රැස් කිරීම ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ සංඛ්‍යාලේඛන අංශය මගින් ඉටු කරනු ලබයි.

ධීවර සංඛ්‍යාති - 2015 ප්‍රකාශනය මුද්‍රණය සඳහා සකස් කර ඇත. කරදිය හා මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය යටතේ විශාල මත්ස්‍යයන් පිළිබඳ දත්ත රැස්කිරීමේ ක්‍රමවේදය ඉන්දියානු සාගර ටූනා කොමිසමේ(IOTC) සහයෝගය මත වැඩි දියුණු කිරීම සිදු කෙරින. මීට අමතරව අයිස් නිෂ්පාදනය පිළිබඳ ඇස්තමේන්තු වාර්තාව (2015 ජුනි මස සිට දෙසැම්බර්) ප්‍රකාශයට පත් කර ඇත. ටින් මාළු වෙළඳ පල පිලිබඳව අධ්‍යයනය කිරීමේ සමීක්ෂණයේ (2015 අගෝස්තු මස සිට දෙසැම්බර්) දේශීය මාළු නිෂ්පාදන ආයතන වලින් තොරතුරු එක්රැස් කල අතර පෙබරවාරි මසදී අදාල ප්‍රකාශනය ප්‍රකාශයට පත් කිරීමට නියමිතය.

# 3. පරිපාලනය

## 3.1 අංශ, ශාඛා කාර්යාල හා දිස්ත්‍රික් කාර්යාල

### 3.1.1 අංශ සහ ඒකක

පහත දැක්වෙන තාක්ෂණික හා සේවා අංශ 15 කින් සහ ඒකක 01ක් මගින් 2015 වසර තුල කාර්යයයන් මෙහෙය වන ලද අතර අභ්‍යන්තර විගණන අංශයකින් ද සමන්විත වේ.

| | |
|---|---|
| 1 වන අංශය | ජන සංගණන හා ප්‍රජා විද්‍යා |
| 2 වන අංශය | කර්මාන්ත, ඉදිකිරීම්,වෙළඳ හා සේවා |
| 3 වන අංශය | කෘෂිකර්ම හා පාරිසරික |
| 4 වන අංශය | ජාතික ගිණුම් |
| 5 වන අංශය | ප්‍රකාශන |
| 6 වන අංශය | පුස්තකාල හා ප්‍රලේඛන |
| 7 වන අංශය | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ |
| 8 වන අංශය | ආයතනික හා ගිණුම් |
| 9 වන අංශය | නියැදි සමීක්ෂණ |
| 10 වන අංශය | මුද්‍රණ |
| 11 වන අංශය | ක්ෂේත්‍ර කළමණාකරණ |
| 12 වන අංශය | පුහුණු |
| 15 වන අංශය | පර්යේෂණ හා විශේෂ අධ්‍යයන |
| 16 වන අංශය | මිල හා වේතන |
| 18 වන අංශය | සිතියම් විද්‍යා |

දත්ත නිකුත් කිරීමේ ඒකකය

අභ්‍යන්තර විගණන අංශය

### 3.1.2 අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල පිහිටි ශාඛා කාර්යාල

මෙම දෙපාර්තමේන්තුව විසින් විවිධ දෙපාර්තමේන්තු සහ අමාත්‍යාංශ තුල ශාඛා කාර්යාල 41 ක් පවත්වාගෙන යයි. මෙම ශාඛා කාර්යාල නියෝජ්‍ය අධ්‍යක්ෂවරයෙකු, ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාලේඛනඥවරයෙකු, සංඛ්‍යාලේඛනඥවරයෙකු, සංඛ්‍යාලේඛන නිලධාරීවරයෙකු හෝ සංඛ්‍යාලේඛන සහකාර නිලධාරිවරයෙකු යටතේ පවතී.

### 3.1.3 දිස්ත්‍රික් කාර්යාල

දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලට අනුයුක්ත කොට ඇති දිස්ත්‍රික් කාර්යාල 25 ක් සහ මහවැලි සංවර්ධන බල ප්‍රදේශයට අයත් මහවැලි එච් කලාපයේ තඹුත්තේගම එක් කාර්යාලයක්ද වේ. මෙම කාර්යාල නියෝජ්‍ය අධ්‍යක්ෂවරයෙකු, ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාලේඛනඥවරයෙකු හෝ සංඛ්‍යාලේඛනඥවරයෙකු භාරයේ පවතින අතර ඔහුට සහාය වීමට සංඛ්‍යාලේඛන නිලධාරින් සහ සංඛ්‍යාලේඛන සහකාරවරුන් ද අනුයුක්ත කොට ඇත.ඒ ඒ දිස්ත්‍රික්කය තුළ දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන සමීක්ෂණ, සංගණන වලට අදාලව දත්ත රැස් කිරීම මෙම කාර්යාල මඟින් සිදු කෙරේ. දිස්ත්‍රික්කය තුළ සංඛ්‍යාලේඛන කටයුතු පිළිබඳ සම්බන්ධීකරණය කරනු ලබන්නේද මෙම දිස්ත්‍රික් කාර්යාල මඟිනි.

### 3.1.4 පළාත් සභාවල සංඛ්‍යාලේඛන කාර්ය මණ්ඩලය

වෘත්තීය දක්ෂතා පෙන්වන සංඛ්‍යාලේඛන කාර්ය මණ්ඩලයක් අනුයුක්ත කරමින් පලාත් සභාවලට සංඛ්‍යාලේඛන සේවාව සැපයීම දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව සිදු කරන ලදී. මේ අනුව කාර්ය මණ්ඩලය තාවකාලික පදනම මත මෙම දෙපාර්තමේන්තුවෙන් මුදා හැරීමෙන් පළාත් සභාවලට අනුයුක්ත කර ඇත. වඩාත් සුදුසු සංඛ්‍යානමය සම්බන්ධීකරණය, සංඛ්‍යාලේඛන ප්‍රමිතීන් පවත්වාගෙන යාම හා කාර්ය මණ්ඩලයේ උපරිම ප්‍රයෝජන ලබා ගැනීම මෙමඟින් තහවුරු කර ඇත. තාවකාලික මුදා හැරීම මගින් දෙපාර්තමේන්තුව මෙම නිලධාරීන් සැපයීමට පළාත් සභා සමඟ වැඩ සටහන් සම්පාදනය කරන ලදී.

## 3.2 කාර්ය මණ්ඩලය

| | තනතුර | අනුමත සංඛ්‍යාව | 2015.12.31 දිනට සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 1 | අධ්‍යක්ෂ ජනරාල් | 1 | 1 | 0 |
| 2 | අතිරේක අධ්‍යක්ෂ ජනරාල්(සංඛ්‍යාන) | 3 | 0 | 3 |
| 3 | අතිරේක අධ්‍යක්ෂ ජනරාල්(තොරතුරු තාක්ෂණ) | 1 | 0 | 1 |
| 4 | අතිරේක අධ්‍යක්ෂ ජනරාල්(පරිපාලන) | 1 | 1 | 0 |
| 5 | අධ්‍යක්ෂ (සංඛ්‍යාන) | 11 | 1 | 10 |
| 6 | අධ්‍යක්ෂ (පරිපාලන) | 1 | 0 | 1 |
| 7 | අධ්‍යක්ෂ(තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවය) | 2 | 1 | 1 |
| 8 | ප්‍රධාන ගණකාධිකාරී | 1 | 1 | 0 |
| 9 | ප්‍රධාන අභ්‍යන්තර විගණක | 1 | 1 | 0 |
| 10 | නියෝජ්‍ය අධ්‍යක්ෂ(සංඛ්‍යාන) | 34 | 8 | 26 |
| 11 | නියෝජ්‍ය අධ්‍යක්ෂ(තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ - අධි සේවක) [3] | 4 | 0 | 0 |
| 12 | නියෝජ්‍ය අධ්‍යක්ෂ(තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවය) | 6 | 3 | 3 |

| | | | | |
|---|---|---|---|---|
| 13 | නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂ(පරිපාලන) [1] | 1 | 1 | 0 |
| 14 | සහකාර අධ්‍යක්ෂ(තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවය) | 14 | 7 | 7 |
| 15 | ගණකාධිකාරී [1] | 2 | 2 | 0 |
| 16 | අභ්‍යන්තර විගණක [1] | 1 | 0 | 1 |
| 17 | ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාලේඛනඥ [3] | 37 | 32 | 0 |
| 18 | සංඛ්‍යාලේඛනඥ [1,7] | 200 | 116 | 52 |
| 19 | මුද්‍රණ කළමණාකරු [1] | 1 | 0 | 1 |
| 20 | පද්ධති විශ්ලේෂක/වැඩ සටහන් සම්පාදක [1] | 1 | 0 | 1 |
| 21 | පරිපාලන නිලධාරි | 1 | 1 | 0 |
| 22 | සංඛ්‍යාලේඛන සැළසුම්කරු | 1 | 0 | 1 |
| 23 | පුස්තකාලාධිපති | 3 | 3 | 0 |
| 24 | භාෂා පරිවර්තක | 3 | 2 | 1 |
| 25 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරි | 30 | 0 | 30 |
| 26 | සංඛ්‍යාලේඛන නිලධාරී | 494 | 347 | 147 |
| 27 | සංඛ්‍යාලේඛන සහකාර | 202 | 192 | 0 |
| 28 | සංවර්ධන නිලධාරි [2] | 64 | 58 | 6 |
| 29 | අයවැය සහකාර [2] | 1 | 1 | 0 |
| 30 | සිතියම් විද්‍යාඥ | 1 | 1 | 0 |
| 31 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර | 250 | 234 | 16 |
| 32 | මුද්‍රණ නිමැවුම්කරු | 5 | 0 | 5 |
| 33 | මුද්‍රණ කාර්මික | 2 | 0 | 2 |
| 34 | කාර්මික නිලධාරි | 1 | 0 | 1 |
| 35 | පෙර මුද්‍රණ සැලසුම්කරු | 2 | 0 | 2 |
| 36 | ඕෆ්සෙට් ලිතෝ මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරු | 1 | 0 | 1 |
| 37 | පද්ධති පාලක [3] | 6 | 2 | 0 |
| 38 | ජ්‍යෙෂ්ඨ පද්ධති ක්‍රියාකරු [3] | 4 | 4 | 0 |
| 39 | වැඩ මූලික (මුද්‍රණ) | 1 | 0 | 1 |
| 40 | රාජ්‍ය කළමනාකරණ සහකාර | 170 | 112 | 58 |
| 41 | දත්ත සටහන් ක්‍රියාකරු | 8 | 6 | 2 |
| 42 | දත්ත සටහන් ක්‍රියාකරු/කේත ලිපිකරු | 42 | 38 | 4 |
| 43 | ලිපිකරු (සිංහල මාධ්‍ය) | 10 | 10 | 0 |
| 44 | ලිපිකරු (දෙමළ මාධ්‍ය) | 20 | 16 | 4 |
| 45 | වෙරිටයිපර් හෙඩ්ලයිනර් [3] | 1 | 0 | 0 |
| 46 | කැමරා ක්‍රියාකරු [3] | 1 | 1 | 0 |
| 47 | පොත් බැඳුම්කරු(මුද්‍රණ) [4] | 1 | 1 | 0 |
| 48 | ලිතෝ යන්ත්‍ර ක්‍රියාකරු [5] | 1 | 1 | 0 |
| 49 | තහඩු සාදන්නා [4] | 1 | 1 | 0 |
| 50 | යන්ත්‍ර පරිචාරක [3] | 2 | 2 | 0 |
| 51 | ටයිප් සෙටර් [6] | 1 | 1 | 0 |
| 52 | කොම්ටො මීටර් ක්‍රියාකරු [3] | 1 | 0 | 0 |

| | | | | |
|---|---|---|---|---|
| 53 | රියදුරු | 55 | 53 | 2 |
| 54 | වායුසමීකරණ යන්ත්‍ර ක්‍රියාකරු [3] | 1 | 1 | 0 |
| 55 | මුද්‍රණ යන්ත්‍ර සහායක | 1 | 0 | 1 |
| 56 | කාර්යාල කාර්ය සහායක තනතුරු (ස්ථිර) | 107 | 87 | 20 |
| 57 | කාර්යාල කාර්ය සහායක තනතුරු (දෙපාර්තමේන්තුගත) | 10 | 10 | 0 |
| | **එකතුව** | **1828** | **1360** | **411** |
| | රියදුරු (අනියම්) | 3 | 1 | 2 |
| | **එකතුව** | **1831** | **1361** | **413** |

1 මෙම තනතුරු අදාළ සේවයේ තනතුරේ /III හෝ II පන්තියේ තනතුරු වේ. සීමාවකින් තොරව සේවක සංඛ්‍යා ශ්‍රේණිගත උසස්වීම් ලබා දෙන බැවින් II ශ්‍රේණියට හෝ I ශ්‍රේණියට උසස්වීමෙන් අනතුරුව වුවද මෙම තනතුරෙහිම රැඳී සිටීමට එම නිලධාරීන්ට සිදුවිය හැක. අනුමත සේවක සංඛ්‍යාව තුළ සේවය කරනු ලබන විට III ශ්‍රේණියේ නිලධාරීන් වැඩ බැලීමේ පදනම මත II ශ්‍රේණියේ තනතුරු සඳහා පත් නොකළ යුතුය.

2 ශ්‍රී ලංකා සංවර්ධන නිලධාරී සේවා ව්‍යවස්ථාවට අන්තර්ග්‍රහණය වීමට යටත්ව

3 තනතුර දරන්නාට පෞද්ගලික වන සේ හා පසුව අහෝසි වීමට යටත්ව

4 තනතුර දරන්නාට පෞද්ගලික වන සේ හා පසුව අහෝසි වීමට යටත්ව නිර්දේශ කරන අතර, මෙම තනතුර අහෝසි වීමෙන් පසු "පෙර මුද්‍රණ සැලසුම්කරු" යන තනතුරු නාමය සහ MT 1-2006A වැටුප් පරිමාණ යටතේ නව තනතුරු 03 ක් නිර්දේශ කෙරේ.

5 තනතුර දරන්නාට පෞද්ගලික වන සේ හා පසුව අහෝසි වීමට යටත්ව නිර්දේශ කරන අතර, මෙම තනතුර අහෝසි වීමෙන් පසු "ඕෆ්සෙට් ලිතෝ මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරු" යන තනතුරු නාමය සහ MT 1-2006A වැටුප් පරිමාණය සඳහා නව තනතුරු 04 ක් බඳවා ගැනීම සිදුකිරීම නිර්දේශ කෙරේ.

6 තනතුර දරන්නාට පෞද්ගලික වන සේ හා පසුව අහෝසි වීමට යටත්ව නිර්දේශ කරන අතර, මෙම තනතුර අහෝසි වීමෙන් පසු "කොම්පියුටර් ටයිප් සෙටර්/රටා සිත්තම්කරු" යන තනතුරු නාමය සහ MT 1-2006A වැටුප් පරිමාණ යටතේ නව තනතුරු 02 ක් නිර්දේශ කෙරේ.

7 අනුමත සංඛ්‍යාලේඛනඥ තනතුරු 200 ක් තුළ ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාලේඛනඥ තනතුරු 37 ද ඇතුළත්ව ඇති බැවින් බඳවා ගැනීම් කිරීමේදී පුරප්පාඩු සංඛ්‍යාව සැලකිය යුත්තේ එම තනතුරු දෙක ම සඳහා ඒකාබද්ධ සේවක සංඛ්‍යාව 200 ක් සේ සලකමිනි.

## 3.3 විදේශ සම්මේලන, සම්මන්ත්‍රණ හා වැඩමුළුවලට සහභාගිවීම - 2015

| | | |
|---|---|---|
| 1 | ආර්.එම්.එම්.කේ. ඒකනායක මයා සංඛ්‍යාලේඛනඥ | 2015 ජනවාරි 20 සිට 23 දක්වා තායිලන්තයේ පැවති ආසියා හා පැසිපික් කලාපීය රටවල් සඳහා පළමුවන වැඩමුළුව |
| 2 | යූ.එස්. දිල්රුක්ෂි මිය සංඛ්‍යාලේඛනඥ | 2015 ජනවාරි 26 සිට 30 දක්වා මැලේසියාවේ පැවැති සංඛ්‍යාන ව්‍යාපාර ලැයිස්තුව පිළිබඳ කලාපීය පාඨමාලාව |
| 3 | ඩබ්.එම්.සී.එන්.කේ. විජේපාල මෙය සංඛ්‍යාලේඛනඥ | 2015 ජනවාරි 26 සිට 30 දක්වා මැලේසියාවේ පැවැති සංඛ්‍යාන ව්‍යාපාර ලැයිස්තුව පිළිබඳ කලාපීය පාඨමාලාව |
| 4 | ආචාර්ය ඒ.ජේ. සතරසිංහ මයා අධ්‍යක්ෂ ජනරාල් | 2015 පෙබරවාරි 10 සිට 11 දක්වා ඉන්දියාවේ පැවති දකුණු ආසියා Geospatial වැඩමුළුව |
| 5 | ඩබ්.පී.එස්. සිසිලරත්න මයා සංඛ්‍යාලේඛනඥ | 2015 මාර්තු 17 තායිලන්තයේ පැවති ආසියා හා පැසිපික් කලාපීය ආපදා කළමනාකරන සංඛ්‍යාති පිළිබඳව විශේෂඥ කණ්ඩායමේ 02 වන රැස්වීම |
| 6 | එස්. තනබාලසිංහම් මයා ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාලේඛනඥ | 2015 මාර්තු 17 සිට 20 දක්වා තායිලන්තයේ පැවති කෘෂිකර්මාන්තය හා ග්‍රාමීය සංඛ්‍යාති වල උපාය මාර්ගික සැලසුම් පිළිබඳව වැඩමුළුව හා 04 වන කලාපීය මෙහෙයුම් කමිටුව |

| | | |
|---|---|---|
| 7 | අයි.ආර්. බණ්ඩාර මිය<br>අධ්‍යක්ෂ | 2015 මාර්තු 25 සිට 27 දක්වා තායිලන්තයේ පැවති සංඛ්‍යාලේඛන කමිටුවේ 04 වන සැසිවාරය |
| 8 | ආචාර්ය ඒ.ජේ. සතරසිංහ මයා<br>අධ්‍යක්ෂ ජනරාල් | 2015 අප්‍රේල් 08 සිට 09 දක්වා පිලිපීනයේ පැවති ආදාන හා ප්‍රතිදාන වගු යාවත්කාලීන කිරීම හා ගොඩනැගීම, තෝරාගත් දියුණු වෙමින් පවතින සාමාජික රටවල ආර්ථික ව්‍යාපෘති පරීක්ෂණ රැස්වීම |
| 9 | වයි.පී. රාජපක්ෂ මිය<br>සංඛ්‍යාලේඛනඥ | 2015 අප්‍රේල් 08 සිට 09 දක්වා පිලිපීනයේ පැවති ආදාන හා ප්‍රතිදාන වගු යාවත්කාලීන කිරීම හා ගොඩනැගීම, තෝරාගත් දියුණු වෙමින් පවතින සාමාජික රටවල ආර්ථික ව්‍යාපෘති පරීක්ෂණ රැස්වීම |
| 10 | එච්.ආර්.එස්.එල්. රණතුංග මයා<br>සංඛ්‍යාලේඛනඥ | 2015 අප්‍රේල් 14 සිට 16 දක්වා පිලපීනයේ පැවති භාණ්ඩ හා සේවා වෙළඳ සංඛ්‍යාති පිළිබඳ ජාත්‍යන්තර සමුළුව |
| 11 | පී.එම්.පී. අනුරකුමාර මයා<br>අධ්‍යක්ෂ | 2015 අප්‍රේල් 20 සිට 24 දක්වා තායිලන්තයේ පැවති SUA වලංගුභාවය පිලිබඳ වඩා හොඳ දැනුවත්වීමේ ප්‍රතිපත්ති හා පුහුණු වැඩසටහන් සඳහා සහයවීමට සංඛ්‍යානමය ධාරිතා ඉහල දැමීමට සමාන ආහාර ආරක්ෂක හා පෝෂන තොරතුරු පිලිබඳ කලාපීය ව්‍යාපෘති |
| 12 | ඊ.එම්.සී. ද සේරම් මයා<br>සංඛ්‍යාලේඛනඥ | 2015 අප්‍රේල් 29 සිට 30 දක්වා බංගලාදේශයේ පැවති ආසියා පැසිපික් කලාපීය රටවල්හි උසස් සාමාන්‍ය දත්ත නිකුත් කිරීමේ පද්ධතිය (GDDS ) පිළිබඳ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ වැඩමුළුව |
| 13 | සී.පී. චන්ද්‍රසේකර මිය<br>සංඛ්‍යාලේඛනඥ | 2015 මැයි 05 සිට 08 දක්වා වියට්නාමයේ පැවති හරිත ආර්ථික දර්ශක පිළිබඳ සංවර්ධන ගිණුම් ව්‍යාපෘති |
| 14 | කේ.එම්.ආර්. වික්‍රමසිංහ මයා<br>සහකාර අධ්‍යක්ෂ | 2015 මැයි 17 සිංගප්පූරුවේ පැවති සංවර්ධන ප්‍රතිපත්ති සඳහා විශාල දත්ත සාක්ෂි |
| 15 | ඩබ්. ජිනදාස මයා<br>සංඛ්‍යාලේඛනඥ | 2015 මැයි 18 සිට 20 දක්වා චීනයේ පැවති කෙටිකාලීන දත්ත පිළිබඳ ජාත්‍යන්තර සමුළුව |
| 16 | ඩබ්.එම්.ජේ.යූ.බී. වීරතුංග මයා<br>සංඛ්‍යාලේඛනඥ | 2015 මැයි 25 සිට 29 දක්වා සිංගප්පූරුවේ පැවති ත්‍රෛමාසික ජාතික ගිණුම් අත්පොත (කාර්ය සංග්‍රහය) පිළිබඳ සම්මන්ත්‍රණය |
| 17 | කේ.ජී.එම්.ඩබ්. කුමාරි මිය<br>සංඛ්‍යාලේඛන සහකාර | 2015 මැයි 25 සිට 29 දක්වා සිංගප්පූරුවේ පැවති ත්‍රෛමාසික ජාතික ගිණුම් අත්පොත (කාර්ය සංග්‍රහය) පිළිබඳ සම්මන්ත්‍රණය |
| 18 | ඒ.එම්.යූ.කේ. අලහකෝන් මයා<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ | 2015 මැයි 26 සිට 28 දක්වා තායිලන්තයේ පැවති ICP හා SNA පිළිබඳ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සංකයාන දෙපාර්තමේන්තුවේ ව්‍යාපෘතිය - අවසාන වැඩමුළුව |
| 19 | කේ.ඩී.පී. ප්‍රියදර්ශන මයා<br>සංඛ්‍යාලේඛන නිලධාරි | 2015 මැයි 26 සිට 28 දක්වා තායිලන්තයේ පැවති ICP හා SNA පිළිබඳ අන්තර්ජාතික මූල්‍ය අරමුදලේ සංඛ්‍යාන දෙපාර්තමේන්තුවේ ව්‍යාපෘතිය - අවසාන වැඩමුළුව |
| 20 | ටී. තිරුඥානදීපන් මයා<br>සංඛ්‍යාලේඛන නිලධාරි | 2015 ජූනි 01 සිට 12 දක්වා කොරියාවේ පැවති සංඛ්‍යානමය ධාරිතාව සවිමත් කිරීමේ පුහුණු වැඩසටහන |
| 21 | ඩබ්.එම්.සී. ප්‍රනාන්දු මිය<br>සංඛ්‍යාලේඛන නිලධාරි | 2015 ජූනි 09 සිට 12 දක්වා තායිලන්තයේ පැවති දකුණු ආසියාවේ VAW දත්ත රැස් කිරීමේ ජාතික ධාරිතාව සවිමත් කිරීමේ වැඩමුළුව |

| | | |
|---|---|---|
| 22 | කේ.ජී. තිලකරත්න මයා<br>අධ්‍යක්ෂ | 2015 ජුනි 22 සිට 26 දක්වා සහ 2015 ජුනි 29 සිට ජූලි 03 දක්වා තායිලන්තයේ පැවති වගු රාමු භාවිතය හා සැපයීම පිළිබඳව හා 2015 වසර සඳහා මිලදී ගැනීමේ සමානත්වය යාවත්කාලීන කිරීමේ ක්‍රමවේදය පිළිබඳ වැඩමුළුව |
| 23 | ඊ.එම්.එම්.කේ. ඒකනායක මයා<br>සංඛ්‍යාලේඛනඥ | 2015 ජුනි 22 සිට 26 දක්වා සහ 2015 ජුනි 29 සිට ජූලි 03 දක්වා තායිලන්තයේ පැවති වගු රාමු භාවිතය හා සැපයීම පිළිබඳව හා 2015 වසර සඳහා මිලදී ගැනීමේ සමානත්වය යාවත්කාලීන කිරීමේ ක්‍රමවේදය පිළිබඳ වැඩමුළුව |
| 24 | ඒ.ජී.එස්. කාරියවසම් මයා<br>සංඛ්‍යාලේඛනඥ | 2015 ජුනි 22 සිට 26 දක්වා සහ 2015 ජුනි 29 සිට ජූලි 03 දක්වා තායිලන්තයේ පැවති ආදාන ප්‍රතිදාන වගු පිළිබඳව හා 2015 වසර සඳහා මිලදී ගැනීමේ සමානත්වය යාවත්කාලීන කිරීමේ ක්‍රමවේදය පිළිබඳ වැඩමුළුව |
| 25 | ඊ.ඒ.ඒ.පී. එගොඩවත්ත මිය<br>සංඛ්‍යාලේඛනඥ | 2015 ජුනි 23 සිට 26 දක්වා තායිලන්තයේ පැවති සමානත්වය ඇති ඉලක්කගත තොරතුරු පිළිබඳ තාක්ෂණික ක්‍රියාකාරි සමුළුව |
| 26 | ඩී.ඩී. බස්නායක මිය<br>සංඛ්‍යාලේඛනඥ | 2015 ජුනි 23 සිට 26 දක්වා තායිලන්තයේ පැවති සාධාරණත්වය ඉලක්කගත UNICEF/UNESCAP ඒකාබද්ධ තාක්ෂණික ක්‍රියාකාරි සමුළුව |
| 27 | කේ.පී.එස්.පී. ද සිල්වා<br>අර්ශකුලරත්න මයා<br>සංඛ්‍යාලේඛනඥ | 2015 ජුනි 24 සිට 26 දක්වා චීනයේ පැවති සංඛ්‍යානමය Metadata ප්‍රමිතිය හා එහි යෙදවීම පිළිබඳ ජාත්‍යන්තර වැඩමුළුව |
| 28 | එන්.ඒ. ඒකනායක මයා<br>සංඛ්‍යාලේඛන නිලධාරි | 2015 ජුනි 24 සිට 26 දක්වා චීනයේ පැවති සංඛ්‍යානමය Metadata ප්‍රමිතිය හා එහි යෙදවීම පිළිබඳ ජාත්‍යන්තර වැඩමුළුව |
| 29 | එච්.එම්.සී.එල්.කේ. හේරත් මයා<br>සංඛ්‍යාලේඛනඥ | 2015 ජූලි 06 සිට 10 දක්වා ජපානයේ පැවති අවිධිමත් ආර්ථික, වැඩ හා රැකියා විධිමත් කිරීමේ කලාපීය සංඛ්‍යාති |
| 30 | ඩී.එම්.කේ.පී.කේ. දිසානායක මයා<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ | 2015 ජූලි 13 සිට 17 දක්වා කොරියාවේ පැවති සංඛ්‍යානමය සාක්ෂරතාවය පිළිබඳ කලාපීය වැඩමුළුව කෘෂිකාර්මික හා ග්‍රාමීය සංඛ්‍යාති ඵලදායිව භාවිතා කිරීම ඉහල දැමීම |
| 31 | ඩබ්.ඩබ්.එම්.ඒ.එස්. ප්‍රේමකුමාර මයා<br>අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | 2015 ජූලි 13 සිට 17 දක්වා සිංගප්පූරුවේ පැවති නේවාසික දේපල මිල දර්ශක |
| 32 | ඩී.පී.ඩබ්.ඩී. වර්ණසූරිය මිය<br>සංඛ්‍යාලේඛනඥ | 2015 ජූලි 13 සිට 17 දක්වා සිංගප්පූරුවේ පැවති නේවාසික දේපල මිල දර්ශක |
| 33 | එස්.ඒ. දසනායක මයා<br>සංඛ්‍යාලේඛන නිලධාරි | 2015 ජූලි 13 සිට 17 දක්වා කොරියාවේ පැවති සංඛ්‍යානමය සාක්ෂරතාවය පිළිබඳ කලාපීය වැඩමුළුව කෘෂිකාර්මික හා ග්‍රාමීය සංඛ්‍යාති ඵලදායිව භාවිතා කිරීම ඉහල දැමීම |
| 34 | කේ.එම්.ඩී.එස්.ඩී. කරුණාරත්න මිය<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ | 2015 අගෝස්තු 08 සිට 15 දක්වා කොරියාවේ පැවති SNA පිළිබඳ ක්‍රියාකාරි මට්ටමේ පුහුණුව |
| 35 | යූ.එස්. වනපුෂ්ප මයා<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ | 2015 අගෝස්තු 08 සිට 15 දක්වා කොරියාවේ පැවති SNA පිළිබඳ ක්‍රියාකාරි මට්ටමේ පුහුණුව |
| 36 | බී.ජී.කේ. ප්‍රේමලතා මිය<br>ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාලේඛනඥ | 2015 අගෝස්තු 08 සිට 15 දක්වා කොරියාවේ පැවති SNA පිළිබඳ ක්‍රියාකාරි මට්ටමේ පුහුණුව |

| | | |
|---|---|---|
| 37 | ආර්.ඩී.ජේ.යූ. රාජපක්ෂ මයා<br>ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාලේඛනඥ | 2015 අගෝස්තු 08 සිට 15 දක්වා කොරියාවේ පැවති SNA පිළිබඳ ක්‍රියාකාරි මට්ටමේ පුහුණුව |
| 38 | වී.පී. ලලිත් මයා<br>ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාලේඛනඥ | 2015 අගෝස්තු 08 සිට 15 දක්වා කොරියාවේ පැවති SNA පිළිබඳ ක්‍රියාකාරි මට්ටමේ පුහුණුව |
| 39 | එන්.එම්.ඒ.කේ. නවරත්න මයා<br>ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාලේඛනඥ | 2015 අගෝස්තු 08 සිට 15 දක්වා කොරියාවේ පැවති SNA පිළිබඳ ක්‍රියාකාරි මට්ටමේ පුහුණුව |
| 40 | බී.ඒ.යූ වර්ණසිරි මයා<br>සංඛ්‍යාලේඛනඥ | 2015 අගෝස්තු 08 සිට 15 දක්වා කොරියාවේ පැවති SNA පිළිබඳ ක්‍රියාකාරි මට්ටමේ පුහුණුව |
| 41 | ඩබ්.එම්.ඒ.යූ.බී. වීරතුංග මයා<br>සංඛ්‍යාලේඛනඥ | 2015 අගෝස්තු 08 සිට 15 දක්වා කොරියාවේ පැවති SNA පිළිබඳ ක්‍රියාකාරි මට්ටමේ පුහුණුව |
| 42 | එස්.යූ.ඩී. අලහකෝන් මයා<br>සංඛ්‍යාලේඛනඥ | 2015 අගෝස්තු 08 සිට 15 දක්වා කොරියාවේ පැවති SNA පිළිබඳ ක්‍රියාකාරි මට්ටමේ පුහුණුව |
| 43 | අයි.සී. ප්‍රේමරත්න මිය<br>සංඛ්‍යාලේඛනඥ | 2015 අගෝස්තු 08 සිට 15 දක්වා කොරියාවේ පැවති SNA පිළිබඳ ක්‍රියාකාරි මට්ටමේ පුහුණුව |
| 44 | කේ.ඒ.එස්.පී. කොඩිකාර මිය<br>සංඛ්‍යාලේඛනඥ | 2015 අගෝස්තු 08 සිට 15 දක්වා කොරියාවේ පැවති SNA පිළිබඳ ක්‍රියාකාරි මට්ටමේ පුහුණුව |
| 45 | එන්.ඩබ්. දිසානායක මිය<br>සංඛ්‍යාලේඛනඥ | 2015 අගෝස්තු 08 සිට 15 දක්වා කොරියාවේ පැවති SNA පිළිබඳ ක්‍රියාකාරි මට්ටමේ පුහුණුව |
| 46 | එච්.එම්.එන්.කේ. හෙන්නායක මිය<br>සංඛ්‍යාලේඛන නිලධාරි | 2015 අගෝස්තු 08 සිට 15 දක්වා කොරියාවේ පැවති SNA පිළිබඳ ක්‍රියාකාරි මට්ටමේ පුහුණුව |
| 47 | ටී.පී.ජී.ඩබ්.කේ. තෙන්නකෝන් මිය<br>සංඛ්‍යාලේඛන නිලධාරි | 2015 අගෝස්තු 08 සිට 15 දක්වා කොරියාවේ පැවති SNA පිළිබඳ ක්‍රියාකාරි මට්ටමේ පුහුණුව |
| 48 | වී. මාදවන් මයා<br>සංඛ්‍යාලේඛන සහකාර | 2015 අගෝස්තු 08 සිට 15 දක්වා කොරියාවේ පැවති SNA පිළිබඳ ක්‍රියාකාරි මට්ටමේ පුහුණුව |
| 49 | එම්. නිමලන් මයා<br>සංඛ්‍යාලේඛන සහකාර | 2015 අගෝස්තු 12 සිට 2016 දෙසැම්බර් 14 දක්වා කොරියාවේ පැවැත්වෙන ආර්ථික සංවර්ධනය සහයෝගීතාව පිළිබඳ කොරියානු අත්දැකීම් - ශාස්ත්‍රපති උපාධිය |
| 50 | එම්.ඩී.එස්. සේනානායක මයා<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ | 2015 අගෝස්තු 15 සිට 22 දක්වා කොරියාවේ පැවති නියැදිකරණය පිළිබඳ ක්‍රියාකාරි මට්ටමේ පුහුණුව |
| 51 | ජේ.එස්.එන්.පී. ධර්මවර්ධන මයා<br>ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාලේඛනඥ | 2015 අගෝස්තු 15 සිට 22 දක්වා කොරියාවේ පැවති නියැදිකරණය පිළිබඳ ක්‍රියාකාරි මට්ටමේ පුහුණුව |
| 52 | ජී.ටී.කේ.එස්. පෙරේරා මයා<br>ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාලේඛනඥ | 2015 අගෝස්තු 15 සිට 22 දක්වා කොරියාවේ පැවති නියැදිකරණය පිළිබඳ ක්‍රියාකාරි මට්ටමේ පුහුණුව |
| 53 | එම්.එම්. දර්ශනී මිය<br>ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාලේඛනඥ | 2015 අගෝස්තු 15 සිට 22 දක්වා කොරියාවේ පැවති නියැදිකරණය පිළිබඳ ක්‍රියාකාරි මට්ටමේ පුහුණුව |
| 54 | ඩබ්.ඒ.සී. විජේබණ්ඩාර මිය<br>සංඛ්‍යාලේඛනඥ | 2015 අගෝස්තු 15 සිට 22 දක්වා කොරියාවේ පැවති නියැදිකරණය පිළිබඳ ක්‍රියාකාරි මට්ටමේ පුහුණුව |
| 55 | කේ.එස්.ආර්.එල්. සේනාධීර මයා<br>සංඛ්‍යාලේඛනඥ | 2015 අගෝස්තු 15 සිට 22 දක්වා කොරියාවේ පැවති නියැදිකරණය පිළිබඳ ක්‍රියාකාරි මට්ටමේ පුහුණුව |
| 56 | එම්.එල්.කේ.පී. කුමාර මයා<br>සංඛ්‍යාලේඛනඥ | 2015 අගෝස්තු 15 සිට 22 දක්වා කොරියාවේ පැවති නියැදිකරණය පිළිබඳ ක්‍රියාකාරි මට්ටමේ පුහුණුව |
| 57 | එම්.ඩී.ඩී.ඩී. දීපවංශ මිය<br>සංඛ්‍යාලේඛනඥ | 2015 අගෝස්තු 15 සිට 22 දක්වා කොරියාවේ පැවති නියැදිකරණය පිළිබඳ ක්‍රියාකාරි මට්ටමේ පුහුණුව |

| | | |
|---|---|---|
| 58 | එල්.ඒ.ඩී.ඩී.පී. ජයසේකර මිය<br>සංඛ්‍යාලේඛන නිලධාරි | 2015 අගෝස්තු 15 සිට 22 දක්වා කොරියාවේ පැවති නියැදිකරණය පිළිබඳ ක්‍රියාකාරි මට්ටමේ පුහුණුව |
| 59 | එස්. බාලශන්කර් මයා<br>සංඛ්‍යාලේඛන සහකාර | 2015 අගෝස්තු 15 සිට 22 දක්වා කොරියාවේ පැවති නියැදිකරණය පිළිබඳ ක්‍රියාකාරි මට්ටමේ පුහුණුව |
| 60 | ඩබ්. ජයනෙත්ති ආරච්චි මිය<br>සංඛ්‍යාලේඛන නිලධාරි | 2015 අගෝස්තු 19 සිට 21 දක්වා චීනයේ පැවති ගෘහස්ථ මිල දර්ශක පිළිබඳ ජාත්‍යන්තර වැඩමුළුව |
| 61 | ජී.ජී. ගුණසේකර මිය<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ | 2015 සැප්තැම්බර් 07 සිට 25 දක්වා කොරියාවේ පැවති සංඛ්‍යානමය උපදේශක පුහුණුව |
| 62 | ඩබ්.එච්.ඩී.සී.පී. විජේසූරිය මයා<br>ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාලේඛනඥ | 2015 සැප්තැම්බර් 07 සිට 25 දක්වා කොරියාවේ පැවති සංඛ්‍යානමය උපදේශක පුහුණුව |
| 63 | එච්.ඩබ්.එම්. ජයවීර මයා<br>සංඛ්‍යාලේඛනඥ | 2015 සැප්තැම්බර් 07 සිට 25 දක්වා කොරියාවේ පැවති සංඛ්‍යානමය උපදේශක පුහුණුව |
| 64 | ආර්.ඩී.එන්. කරුණාසිරි මයා<br>සංඛ්‍යාලේඛනඥ | 2015 සැප්තැම්බර් 07 සිට 25 දක්වා කොරියාවේ පැවති සංඛ්‍යානමය උපදේශක පුහුණුව |
| 65 | කේ.ටී. සුරේෂ්කුමාර් මයා<br>සංඛ්‍යාලේඛනඥ | 2015 සැප්තැම්බර් 07 සිට 25 දක්වා කොරියාවේ පැවති සංඛ්‍යානමය උපදේශක පුහුණුව |
| 66 | ජේ.එම්.එස්.යූ.බී. ජයමහ මයා<br>සංඛ්‍යාලේඛනඥ | 2015 සැප්තැම්බර් 07 සිට 25 දක්වා කොරියාවේ පැවති සංඛ්‍යානමය උපදේශක පුහුණුව |
| 67 | යූ.වී.ආර්.එස්. ගුණවර්ධන මයා<br>සංඛ්‍යාලේඛන නිලධාරි | 2015 සැප්තැම්බර් 07 සිට 25 දක්වා කොරියාවේ පැවති සංඛ්‍යානමය උපදේශක පුහුණුව |
| 68 | යූ.එන්.එස්. ද සිල්වා මයා<br>සංඛ්‍යාලේඛන නිලධාරි | 2015 සැප්තැම්බර් 07 සිට 25 දක්වා කොරියාවේ පැවති සංඛ්‍යානමය උපදේශක පුහුණුව |
| 69 | එච්.ඒ.ආර්. අබේරත්න මයා<br>සංඛ්‍යාලේඛන නිලධාරි | 2015 සැප්තැම්බර් 07 සිට 25 දක්වා කොරියාවේ පැවති සංඛ්‍යානමය උපදේශක පුහුණුව |
| 70 | ඩබ්.ඒ.පී.එස්. පෙරේරා මයා<br>සංඛ්‍යාලේඛන නිලධාරි | 2015 සැප්තැම්බර් 07 සිට 25 දක්වා කොරියාවේ පැවති සංඛ්‍යානමය උපදේශක පුහුණුව |
| 71 | කේ.කේ.සී. ශිරෝමලී මෙය<br>ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාලේඛනඥ | 2015 සැප්තැම්බර් 16 සිට 17 දක්වා කොරියාවේ පැවති ජාතික සංඛ්‍යාන පද්ධතියට තිරසාර සංවර්ධන ඉලක්කයන්ගේ අභියෝග පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණය |
| 72 | ටී.එච්. මීගොඩ මිය<br>සංඛ්‍යාලේඛන නිලධාරි | 2015 සැප්තැම්බර් 16 සිට 18 දක්වා ඉන්දියාවේ පැවති දකුණු ආසියාව සඳහා මූල්‍ය වාර්තාකරණය හා සම්පත් යෙදවීම පිළිබඳ අතුරු කලාපීය ධාරිතාව ගොඩ නැංවීමේ වැඩමුළුව |
| 73 | ඩබ්.ඩබ්.එම්.ඒ.එස්. ප්‍රේමකුමාර මයා<br>අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | 2015 සැප්තැම්බර් 21 සිට 23 දක්වා තායිලන්තයේ පැවති ආසියා පැසිපික් කලාපීය හා උප කලාපීය ප්‍රමුඛතාව හඳුනා ගැනීමට තිරසාර සංවර්ධන ඉලක්ක මෙහෙයවීමේ සමුළුව |
| 74 | පී.එම්.පී. අනුර කුමාර මයා<br>අධ්‍යක්ෂ | 2015 සැප්තැම්බර් 21 සිට 25 දක්වා තායිලන්තයේ පැවති ආහාර සුරක්ෂිතතා සංඛ්‍යාති පිළිබඳ කලාපීය පුහුණු වැඩසටහන |
| 75 | ජේ. ලියනගේ මයා<br>සංඛ්‍යාලේඛනඥ | 2015 සැප්තැම්බර් 21 සිට 25 දක්වා තායිලන්තයේ පැවති ආහාර සුරක්ෂිතතා සංඛ්‍යාති පිළිබඳ කලාපීය පුහුණු වැඩසටහන |
| 76 | ඩී.එම්.එන්. බණ්ඩාර මයා<br>ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාලේඛනඥ | 2015 සැප්තැම්බර් 23 සිට 26 දක්වා මලයාසියාවේ පැවති ADB කලාපීය සමුළුව |

| | | |
|---|---|---|
| 77 | ඩබ්.ටී.ජී.එන්.සී. වීරසිංහ මයා<br>සංඛ්‍යාලේඛන නිලධාරි | 2015 සැප්තැම්බර් 23 සිට 26 දක්වා මලයාසියාවේ පැවති ADB කලාපීය සමුළුව |
| 78 | කේ.කේ.බී. ගුණතිලක මයා<br>සංඛ්‍යාලේඛන නිලධාරි | 2015 සැප්තැම්බර් 28 සිට 30 දක්වා තායිලන්තයේ පැවති 2015 SDMX ගෝලීය සම්මන්ත්‍රණය |
| 79 | බී.කේ.එස්. බන්දුල මයා<br>සංඛ්‍යාලේඛන නිලධාරි | 2015 ඔක්තෝම්බර් 05 සිට 10 දක්වා කොරියවේ පැවති 20 වන UNRCC – AP Plenary රැස්වීම |
| 80 | එස්.ටී.සී. ගවේශිකා මිය<br>සංඛ්‍යාලේඛනඥ | 2015 ඔක්තෝම්බර් 05 සිට 09 දක්වා ඉන්දියාවේ පැවති සෞඛ්‍ය හා ප්‍රජා විද්‍යාත්මක සංඛ්‍යාති පිළිබඳ පුහුණු පාඨමාලාව |
| 81 | ටී.එස්.ටී. හෙට්ටිගේ මිය<br>සංඛ්‍යාලේඛනඥ | 2015 ඔක්තෝම්බර් 07 සිට 09 දක්වා තායිලන්තයේ පැවති ගිණිකොන දිග ආසියා වැඩමුළුව - ස්ත්‍රී පුරුෂ සමානත්වය හා කාන්තා සවිබල ගැන්වීම සඳහා සංඛ්‍යාතීන්හි වගකීම ඉහල දැමීම හා ශක්තිමත් කිරීම |
| 82 | ඒ.එන්.ඩී. සිල්වා මිය<br>සංඛ්‍යාලේඛනඥ | 2015 ඔක්තෝම්බර් 07 සිට 09 දක්වා තායිලන්තයේ පැවති ගිණිකොන දිග ආසියා වැඩමුළුව - ස්ත්‍රී පුරුෂ සමානත්වය හා කාන්තා සවිබල ගැන්වීම සඳහා සංඛ්‍යාතීන්හි වගකීම ඉහල දැමීම හා ශක්තිමත් කිරීම |
| 83 | එස්.එම්.එච්.එන්. සමරකෝන් මයා<br>සංඛ්‍යාලේඛනඥ | 2015 ඔක්තෝම්බර් 14 සිට 15 දක්වා කොරියාවේ පැවති ආසියානු රටවල බදු ආදායම් සංඛ්‍යාති රාමු පිළිබඳ සම්මන්ත්‍රණය |
| 84 | අයි.එච්.ජේ. රොහාන් මයා<br>සංඛ්‍යාලේඛන නිලධාරි | 2015 ඔක්තෝම්බර් 14 සිට 15 දක්වා කොරියාවේ පැවති ආසියානු රටවල බදු ආදායම් සංඛ්‍යාති රාමු පිළිබඳ සම්මන්ත්‍රණය |
| 85 | සී.ඩී. ද සිල්වා මිය<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ | 2015 ඔක්තෝම්බර් 19 චීනයේ පැවති ගොඩබිම හා සමුද්‍රීය සේද මාර්ග ඔස්සේ ඇති රටවල සංඛ්‍යානමය සම්මන්ත්‍රණය |
| 86 | සී.ඩී. ද සිල්වා මිය<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ | 2015 ඔක්තෝම්බර් 20 සිට 22 දක්වා චීනයේ පැවති 'තිරසාර සංවර්ධනයට තිරසාර දත්ත' ලෝක සංඛ්‍යාති තේමාව යටතේ ජාත්‍යන්තර සම්මන්ත්‍රණය |
| 87 | ඩබ්.ඒ.ඩී.ආර්.ඩී. අතුකෝරල මිය<br>සංඛ්‍යාලේඛනඥ | 2015 ඔක්තෝම්බර් 29 සිට 30 දක්වා තායිලන්තයේ පැවති ආසියා හා පැසිපික් කලාපීය ආපදා සම්බන්ධ සංඛ්‍යාතීන් පිළිබඳ විශේෂඥ කණ්ඩායමේ 3 වන රැස්වීම |
| 88 | යූ. මහේෂ්වරන් මිය<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ | 2015 නොවැම්බර් 02 සිට27 දක්වා ඕස්ට්‍රේලියාවේ පැවති ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ හැකියාවන් වර්ධනය සඳහා පුහුණුව |
| 89 | එස්.එච්. මන්සූර් මයා<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ | 2015 නොවැම්බර් 02 සිට27 දක්වා ඕස්ට්‍රේලියාවේ පැවති ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ හැකියාවන් වර්ධනය සඳහා පුහුණුව |
| 90 | ඩී.ඩී.ජී.ඒ. සෙනවිරත්න මිය<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ | 2015 නොවැම්බර් 02 සිට27 දක්වා ඕස්ට්‍රේලියාවේ පැවති ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ හැකියාවන් වර්ධනය සඳහා පුහුණුව |
| 91 | සී. ජයවික්‍රම මිය<br>ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාලේඛනඥ | 2015 නොවැම්බර් 02 සිට27 දක්වා ඕස්ට්‍රේලියාවේ පැවති ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ හැකියාවන් වර්ධනය සඳහා පුහුණුව |
| 92 | වයි.ජී.ආර්.අයි. කුලතිලක මිය<br>ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාලේඛනඥ | 2015 නොවැම්බර් 02 සිට27 දක්වා ඕස්ට්‍රේලියාවේ පැවති ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ හැකියාවන් වර්ධනය සඳහා පුහුණුව |

| | | |
|---|---|---|
| 93 | ඩී.ඩබ්.යූ. රාජපක්ෂ මයා<br>ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාලේඛනඥ | 2015 නොවැම්බර් 02 සිට27 දක්වා ඕස්ට්‍රේලියාවේ පැවති ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ හැකියාවන් වර්ධනය සඳහා පුහුණුව |
| 94 | ජී.ටී.කේ.එස්. පෙරේරා මයා<br>ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාලේඛනඥ | 2015 නොවැම්බර් 02 සිට27 දක්වා ඕස්ට්‍රේලියාවේ පැවති ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ හැකියාවන් වර්ධනය සඳහා පුහුණුව |
| 95 | ආර්.එම්.එම්.කේ. ඒකනායක මයා<br>සංඛ්‍යාලේඛනඥ | 2015 නොවැම්බර් 02 සිට27 දක්වා ඕස්ට්‍රේලියාවේ පැවති ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ හැකියාවන් වර්ධනය සඳහා පුහුණුව |
| 96 | ඒ.කේ.ඩී.සී.එන්.එස්. කරුණාරත්න මයා<br>සංඛ්‍යාලේඛනඥ | 2015 නොවැම්බර් 02 සිට27 දක්වා ඕස්ට්‍රේලියාවේ පැවති ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ හැකියාවන් වර්ධනය සඳහා පුහුණුව |
| 97 | යූ.එස්. දිල්රුක්ෂි මිය<br>සංඛ්‍යාලේඛනඥ | 2015 නොවැම්බර් 02 සිට27 දක්වා ඕස්ට්‍රේලියාවේ පැවති ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ හැකියාවන් වර්ධනය සඳහා පුහුණුව |
| 98 | එච්.පී.එල්. ජයරත්න මිය<br>සංඛ්‍යාලේඛනඥ | 2015 නොවැම්බර් 02 සිට27 දක්වා ඕස්ට්‍රේලියාවේ පැවති ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ හැකියාවන් වර්ධනය සඳහා පුහුණුව |
| 99 | කේ.කේ. ද අල්මේදා මිය<br>සංඛ්‍යාලේඛනඥ | 2015 නොවැම්බර් 02 සිට27 දක්වා ඕස්ට්‍රේලියාවේ පැවති ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ හැකියාවන් වර්ධනය සඳහා පුහුණුව |
| 100 | ඩබ්.එස්.ඩී. ජයසුන්දර මිය<br>සංඛ්‍යාලේඛනඥ | 2015 නොවැම්බර් 02 සිට27 දක්වා ඕස්ට්‍රේලියාවේ පැවති ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ හැකියාවන් වර්ධනය සඳහා පුහුණුව |
| 101 | එම්. විද්‍යානන්දනේසන් මයා<br>සංඛ්‍යාලේඛනඥ | 2015 නොවැම්බර් 02 සිට27 දක්වා ඕස්ට්‍රේලියාවේ පැවති ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ හැකියාවන් වර්ධනය සඳහා පුහුණුව |
| 102 | ජී.යූ.එන්. පෙරේරා මයා<br>සංඛ්‍යාලේඛනඥ | 2015 නොවැම්බර් 02 සිට27 දක්වා ඕස්ට්‍රේලියාවේ පැවති ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ හැකියාවන් වර්ධනය සඳහා පුහුණුව |
| 103 | කේ. වීරසිරි මයා<br>සංඛ්‍යාලේඛනඥ | 2015 නොවැම්බර් 02 සිට27 දක්වා ඕස්ට්‍රේලියාවේ පැවති ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ හැකියාවන් වර්ධනය සඳහා පුහුණුව |
| 104 | ඩී.ආර්.එම්.සී.එම්. රත්නායක මයා<br>සංඛ්‍යාලේඛනඥ | 2015 නොවැම්බර් 02 සිට27 දක්වා ඕස්ට්‍රේලියාවේ පැවති ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ හැකියාවන් වර්ධනය සඳහා පුහුණුව |
| 105 | ඩබ්.එම්.සී.එන්.කේ. විජේපාල මිය<br>සංඛ්‍යාලේඛනඥ | 2015 නොවැම්බර් 02 සිට27 දක්වා ඕස්ට්‍රේලියාවේ පැවති ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ හැකියාවන් වර්ධනය සඳහා පුහුණුව |
| 106 | පී. හෙට්ටියානි මයා<br>සංඛ්‍යාලේඛනඥ | 2015 නොවැම්බර් 02 සිට27 දක්වා ඕස්ට්‍රේලියාවේ පැවති ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ හැකියාවන් වර්ධනය සඳහා පුහුණුව |
| 107 | ආචාර්ය ඒ.ජේ. සතරසිංහ මයා<br>අධ්‍යක්ෂ ජනරාල් | 2015 නොවැම්බර් 02 සිට 06 දක්වා කොරියාවේ පැවති සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සඳහා ඉහල මට්ටමේ පුහුණුව/අධ්‍යයන චාරිකාව |

| | | |
|---|---|---|
| 108 | කේ.එම්.මාලනී කුමාරිහාමි මිය<br>අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | 2015 නොවැම්බර් 02 සිට 06 දක්වා කොරියාවේ පැවති සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සඳහා ඉහල මට්ටමේ පුහුණුව/අධ්‍යයන චාරිකාව |
| 109 | ඩී.ජී.එස්.ජී. මුනසිංහ මයා<br>අධ්‍යක්ෂ | 2015 නොවැම්බර් 02 සිට 06 දක්වා කොරියාවේ පැවති සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සඳහා ඉහල මට්ටමේ පුහුණුව/අධ්‍යයන චාරිකාව |
| 110 | අයි.ආර්. බණ්ඩාර මිය<br>අධ්‍යක්ෂ | 2015 නොවැම්බර් 02 සිට 06 දක්වා කොරියාවේ පැවති සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සඳහා ඉහල මට්ටමේ පුහුණුව/අධ්‍යයන චාරිකාව |
| 111 | පී.එම්.පී. අනුර කුමාර මයා<br>අධ්‍යක්ෂ | 2015 නොවැම්බර් 02 සිට 06 දක්වා කොරියාවේ පැවති සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සඳහා ඉහල මට්ටමේ පුහුණුව/අධ්‍යයන චාරිකාව |
| 112 | ආර්.එච්.එස්. අබේනායක මයා<br>අධ්‍යක්ෂ | 2015 නොවැම්බර් 02 සිට 06 දක්වා කොරියාවේ පැවති සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සඳහා ඉහල මට්ටමේ පුහුණුව/අධ්‍යයන චාරිකාව |
| 113 | අයි.ඒ.එම්. ප්‍රනාන්දු මිය<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ | 2015 නොවැම්බර් 02 සිට 06 දක්වා කොරියාවේ පැවති සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සඳහා ඉහල මට්ටමේ පුහුණුව/අධ්‍යයන චාරිකාව |
| 114 | කේ.ඒ.එස්.කොඩිකාර මිය<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ | 2015 නොවැම්බර් 02 සිට 06 දක්වා කොරියාවේ පැවති සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සඳහා ඉහල මට්ටමේ පුහුණුව/අධ්‍යයන චාරිකාව |
| 115 | කේ.ඩබ්.එස්. සද්ධානන්ද මයා<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ | 2015 නොවැම්බර් 02 සිට 06 දක්වා කොරියාවේ පැවති සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සඳහා ඉහල මට්ටමේ පුහුණුව/අධ්‍යයන චාරිකාව |
| 116 | යූ.වී. ජයකොඩි මිය<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ | 2015 නොවැම්බර් 02 සිට 06 දක්වා කොරියාවේ පැවති සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සඳහා ඉහල මට්ටමේ පුහුණුව/අධ්‍යයන චාරිකාව |
| 117 | එස්.සී. වීරසිංහ මිය<br>සංඛ්‍යාලේඛන නිලධාරි | 2015 නොවැම්බර් 02 සිට 06 දක්වා ඉන්දියාවේ පැවති වගා අස්වැන්න ඇස්තමේන්තු සඳහා ආදර්ශ යොදා ගැනීමේ වැඩමුළුව |
| 118 | පී.එස්.එම්. සේනාධීර මිය<br>ප්‍රධාන ගණකාධිකාරි | 2015 නොවැම්බර් 03 සිට 13 දක්වා එංගලන්තයේ පැවති ශ්‍රී ලාංකික මූල්‍ය කළමනාකරුවන් සඳහා විදේශ අධ්‍යයන වැඩසටහන |
| 119 | ඩබ්.බී.එම්.ආර්. වීරසේකර මයා<br>සංඛ්‍යාලේඛන නිලධාරි | 2015 නොවැම්බර් 08 සිට දෙසැම්බර් 21 දක්වා ඉන්දියාවේ පැවැති ග්‍රාමීය සංවර්ධනය සඳහා වූ භූගෝලීය පාඨමාලාව |
| 120 | පී.එන්. උයනගේ මිය<br>සංඛ්‍යාලේඛනඥ | 2015 නොවැම්බර් 09 සිට 22 දක්වා චීනයේ පැවති සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා ජනගහන දත්ත උත්පාදනය පිළිබඳ සම්මන්ත්‍රණය |
| 121 | එන්.කේ.වී.එම්. නිහාල් මයා<br>සංඛ්‍යාලේඛන නිලධාරි | 2015 නොවැම්බර් 09 සිට 22 දක්වා චීනයේ පැවති සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා ජනගහන දත්ත උත්පාදනය පිළිබඳ සම්මන්ත්‍රණය |
| 122 | ඩබ්.එම්.එස්. ලසන්ති මිය<br>සංඛ්‍යාලේඛන නිලධාරි | 2015 නොවැම්බර් 09 සිට 22 දක්වා චීනයේ පැවති සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා ජනගහන දත්ත උත්පාදනය පිළිබඳ සම්මන්ත්‍රණය |

| | | |
|---|---|---|
| 123 | කේ.එම්.ඒ.ආර්.එන්.කේ. අලහකෝන් මිය සංඛ්‍යාලේඛන නිලධාරි | 2015 නොවැම්බර් 09 සිට 22 දක්වා චීනයේ පැවති සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා ජනගහන දත්ත උත්පාදනය පිළිබඳ සම්මන්ත්‍රණය |
| 124 | එස්. සම්සුදීන් මයා සංඛ්‍යාලේඛන නිලධාරි | 2015 නොවැම්බර් 09 සිට 22 දක්වා චීනයේ පැවති සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා ජනගහන දත්ත උත්පාදනය පිළිබඳ සම්මන්ත්‍රණය |
| 125 | ආර්.පී.එස්.පී. රාජපක්ෂ මෙය සංඛ්‍යාලේඛන සහකාර | 2015 නොවැම්බර් 09 සිට 20 දක්වා ඉන්දුනීසියාවේ පැවති කෘෂිකාර්මික හා ග්‍රාමීය සංඛයාති සඳහා ප්‍රධාන දත්ත නිෂ්පාදනය සඳහා නියැදි ක්‍රමවේද පිළිබඳ02 වන කලාපීය පුහුණු පාඨමාලාව |
| 126 | පී.එල්.ඒ.ඒ. හේමන්ත මයා සංඛ්‍යාලේඛනඥ | 2015 නොවැම්බර් 16 සිට 18 දක්වා කොරියාවේ පැවති ආසියා - පැසිපික් කලාපයේ ජාත්‍යන්තර ශ්‍රම සංක්‍රමණය පිළිබඳ 01 වන වැඩමුළුව |
| 127 | ජී.ඩබ්. සිරිවර්ධන මයා සංඛ්‍යාලේඛන නිලධාරි | 2015 නොවැම්බර් 16 සිට 18 දක්වා කොරියාවේ පැවති ආසියා - පැසිපික් කලාපයේ ජාත්‍යන්තර ශ්‍රම සංක්‍රමණය පිළිබඳ 01 වන වැඩමුළුව |
| 128 | අයි.ආර්. බණ්ඩාර මිය අධ්‍යක්ෂ | 2015 නොවැම්බර් 17 සිට 19 දක්වා ජපානයේ පැවති සංඛ්‍යාති සංවර්ධනය සඳහා ජාතික උපාය මාර්ග පිළිබඳ දෙවන කලාපීය පුහුණු පාඨමාලාව |
| 129 | එස්.ඒ.ජේ.සී.බී. සතරසිංහ මයා සංඛ්‍යාලේඛන නිලධාරි | 2015 නොවැම්බර් 17 සිට 19 දක්වා කොරියාවේ පැවති තෝරා ගත් ආසියානු රටවල්හි සංඛ්‍යානමය වැඩසටහන් වල තිරසාර සංවර්ධන ඉලක්ක, අරමුණු හා දර්ශකයන්හි ප්‍රධාන වාහ ශක්තිය සඳහා ශක්‍යතා සංවර්ධනය පිළිබඳ වැඩමුළුව |
| 130 | එම්.ජී.ඩබ්.අයි. ශ්‍යාමලී මිය සංඛ්‍යාලේඛන නිලධාරි | 2015 නොවැම්බර් 17 සිට 19 දක්වා කොරියාවේ පැවති තෝරා ගත් ආසියානු රටවල්හි සංඛ්‍යානමය වැඩසටහන් වල තිරසාර සංවර්ධන ඉලක්ක, අරමුණු හා දර්ශකයන්හි ප්‍රධාන වාහ ශක්තිය සඳහා ශක්‍යතා සංවර්ධනය පිළිබඳ වැඩමුළුව |
| 131 | අයි.පී.ඒ.එස්. පතිරණ මයා සංඛ්‍යාලේඛන සහකාර | 2015 නොවැම්බර් 17 සිට 19 දක්වා කොරියාවේ පැවති තෝරා ගත් ආසියානු රටවල්හි සංඛ්‍යානමය වැඩසටහන් වල තිරසාර සංවර්ධන ඉලක්ක, අරමුණු හා දර්ශකයන්හි ප්‍රධාන වාහ ශක්තිය සඳහා ශක්‍යතා සංවර්ධනය පිළිබඳ වැඩමුළුව |
| 132 | ටී.ඩී.එම්.එස්.ඩී. පෙරේරා මයා සංඛ්‍යාලේඛනඥ | 2015 නොවැම්බර් 23 සිට දෙසැම්බර් 04 දක්වා කොරියාවේ පැවති සංඛ්‍යානමය ධාරිතාව පුළුල් කිරීම සඳහා වූ පුහුණු පාඨමාලාව:SPSS භාවිතයෙන් සංඛ්‍යානමය විශ්ලේෂණය |
| 133 | කේ.ජී. තිලකරත්න මයා අධ්‍යක්ෂ | 2015 නොවැම්බර් 23 සිට 27 දක්වා ඉන්දුනීසියාවේ පැවැති ආදාන ප්‍රතිදාන පිළිබඳ තාක්ෂණික ඇගයීම් වැඩමුළුව |
| 134 | ඩබ්.එම්.ඒ.යූ.බී. වීරතුංග මයා සංඛ්‍යාලේඛනඥ | 2015 නොවැම්බර් 23 සිට 27 දක්වා ඉන්දුනීසියාවේ පැවැති ආදාන ප්‍රතිදාන පිළිබඳ තාක්ෂණික ඇගයීම් වැඩමුළුව |
| 135 | ඒ.ජී.එස්. කාරියවසම් මයා සංඛ්‍යාලේඛනඥ | 2015 නොවැම්බර් 30 සිට දෙසැම්බර් 04 දක්වා ඉන්දුනීසියාවේ පැවති 2015 මිල දී ගැනීමේ සමානතාවය පිළිබඳ කලාපීය පුහුණු හා තාක්ෂණික ඇගයීමේ වැඩමුළුව |
| 136 | ආචාර්ය ඒ.ජේ. සතරසිංහ මයා අධ්‍යක්ෂ ජනරාල් | 2015 දෙසැම්බර් 02 සිට 03 දක්වා ජපානයේ පැවති ආසියා හා පැසිපික් කලාපීය ජාතික සංඛ්‍යාන නිලධාරීන්ගේ, ප්‍රධානීන් සඳහා වන 12 වන කළමනාකරණ සම්මන්ත්‍රණය |

| | | |
|---|---|---|
| 137 | ජී.එස්. උඩුවන මයා<br>ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාලේඛනඥ | 2015 දෙසැම්බර් 02 සිට 04 දක්වා සිංගප්පූරුවේ පැවැති කාලශ්‍රේණි හා පුරෝකථන සම්බන්ධව සාර්ව ආර්ථිකමිතිය පිළිබඳ හඳුන්වා දීමේ වැඩමුළුව |
| 138 | ඩබ්.ඩී.පී.එන්. ගුණරත්න මිය<br>සංඛ්‍යාලේඛන නිලධාරි | 2015 දෙසැම්බර් 02 සිට 04 දක්වා සිංගප්පූරුවේ පැවැති කාලශ්‍රේණි හා පුරෝකථන සම්බන්ධව සාර්ව ආර්ථිකමිතිය පිළිබඳ හඳුන්වා දීමේ වැඩමුළුව |
| 139 | දීපා රටියල මිය<br>සංඛ්‍යාලේඛන නිලධාරි | 2015 දෙසැම්බර් 02 සිට 04 දක්වා සිංගප්පූරුවේ පැවැති කාලශ්‍රේණි හා පුරෝකථන සම්බන්ධව සාර්ව ආර්ථිකමිතිය පිළිබඳ හඳුන්වා දීමේ වැඩමුළුව |
| 140 | අයි.ජී.වී.එල්. දසනායක මිය<br>සංඛ්‍යාලේඛන සහකාර | 2015 දෙසැම්බර් 02 සිට 04 දක්වා සිංගප්පූරුවේ පැවැති කාලශ්‍රේණි හා පුරෝකථන සම්බන්ධව සාර්ව ආර්ථිකමිතිය පිළිබඳ හඳුන්වා දීමේ වැඩමුළුව |
| 141 | එස්. තනබාලසිංහම් මයා<br>ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාලේඛනඥ | 2015 දෙසැම්බර් 08 සිට 09 දක්වා තායිලන්තයේ පැවැති RSC තාක්ෂණික ක්‍රියාකාරි කණ්ඩායමේ 01 වන රැස්වීම සහ කලාපීය මෙහෙයුම් කමිටුවේ 05 වන රැස්වීම - ආසියා පැසිපික් කලාපය සඳහා කෘෂිකාර්මික හා ග්‍රාමීය දත්ත වැඩි දියුණු කිරීමට ගෝලීය උපක්‍රම |

## 3.4 උසස්වීම්, පත්වීම්, මුදාහැරීම්, ඉල්ලා අස්වීම්, සේවය අතහැරයෑම් හා විශ්‍රාමයෑම්

**උසස් කිරීම්**

| | |
|---|---|
| සංඛ්‍යාලේඛනඥ (II ශ්‍රේණියට) | 24 |

**පත් කිරීම්**

| | |
|---|---|
| සංඛ්‍යාලේඛනඥ | 11 |
| සංඛ්‍යාලේඛන නිලධාරී | 36 |

**මුදාහැරීම්**

| | |
|---|---|
| සංඛ්‍යාලේඛනඥ | 01 |
| සංඛ්‍යාලේඛන නිලධාරි | 06 |
| සංඛ්‍යාලේඛන සහකාර | 02 |

**සේවය අතහැරයෑම්**

| | |
|---|---|
| සංඛ්‍යාලේඛන සහකාර | 01 |
| සංවර්ධන නිලධාරි | 01 |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර | 02 |
| දෙමළ මාධ්‍ය කේත ලිපිකරු | 01 |

**විශ්‍රාමයෑම්**

| | |
|---|---|
| නියෝජ්‍ය අධ්‍යක්ෂ | 01 |
| ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාලේඛනඥ | 01 |
| සංඛ්‍යාලේඛනඥ | 08 |
| සංඛ්‍යාලේඛන සැලසුම්කරු | 01 |
| සංඛ්‍යාලේඛන නිලධාරී | 01 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 02 |
| දත්ත සටහන් ක්‍රියාකරු | 01 |

| | |
|---|---|
| වෙරිටයිපර් හෙඩ්ලයිනර් | 01 |
| කොම්ටොමීටර් ක්‍රියාකරු | 01 |
| කාර්යාල කාර්ය සහායක | 01 |

**සේවයෙන් ඉල්ලා අස්වීම්**

| | |
|---|---|
| සංඛ්‍යාලේඛන නිලධාරී | 02 |
| සංඛ්‍යාලේඛන සහකාර | 02 |

**ජීවිතක්ෂයට පත්වීම**

| | |
|---|---|
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර | 01 |
| ගිලටින් යන්ත්‍ර ක්‍රියාකරු | 01 |

## 3.5 අභ්‍යන්තර විගණන කටයුතු

2015 වර්ෂයේදී අභන්තර විගණන අංශය මගින් සිදු කල කාර්ය සාධනය පහත පරිදි වේ.

- 2015 වර්ෂය සඳහා අභ්‍යන්තර විගණන වැඩසටහන පිළියෙල කර විගණකාධිපතිට පිටපතක් සහිතව කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කරන ලදී.
- 2014 වර්ෂයේ නොවැම්බර් මාසය සඳහා ගිණුම් අංශයෙන් ලැබුණු ගෙවූ වවුචර් පත් පරීක්ෂාවට ලක් කරන ලදී.
- 2015 වර්ෂය සඳහා මූලික වර්තාව ඉදිරිපත් කිරීම. (ගිණුම් සාරාංශ වාර්තාව මු:රෙ: 135 බලතල පැවරීම, ප්‍රසම්පාදන සැලැස්ම, 2015 වර්ෂයට අදාල ප්‍රාග්ධන හා පුනරාවර්තන මුදල් පොත්, වැය ලෙජර, බැංකු සැසැඳුම් 2014 විසර්ජන ගිණුම ආදිය පරීක්ෂා කරන ලදී.)
- කළමණාකරණ සහකාර ශ්‍රේණියේ පෞද්ගලික ලිපිගොනු පරීක්ෂාව.
- ප්‍රවාහන අංශයේ අභ්‍යන්තර විගණන පරීක්ෂාව. (වාහන පිරිවැය වාර්තාව සකස් කිරීමේ ප්‍රගතිය පරීක්ෂාව)
- මුදල් පොත්, අග්‍රිම අත්තිකාරම් නිකුත් කිරීම හා පියවීම පිලිබඳ පරීක්ෂාව.
- ජාතික ගිණුම් අංශයේ නිවාඩු පරීක්ෂා කිරීම.
- ප්‍රකාශන අංශයේ සාමාන්‍ය පරිපාලනය සම්බන්ධ විගණන පරීක්ෂාව. (සංඛ්‍යාන අත්පොත, සංඛ්‍යාන නිබන්ධනය හා සංඛ්‍යාන පුවත් පත්‍රිකාව සකස් කිරීමේ ප්‍රගතිය පරීක්ෂා කරන ලදි.)
- කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සංඛ්‍යාලේඛන අංශයේ සාමාන්‍ය පරිපාලනය සම්බන්ධ විගණන පරීක්ෂාව
- 02 වන අංශයේ සාමාන්‍ය පරිපාලනය සම්බන්ධ විගණන පරීක්ෂාව.
- ටයර් බෙදා හැරීම පිළිබඳ පරීක්ෂා කිරීම හා අදාල වාහන වල ලොග් පොත් හා වාහන පිරිවැය වාර්තාව පරීක්ෂා කිරීම. භාණ්ඩ සමීක්ෂණ වාර්ථා වල ඌනතා හා අතිරික්ත පෙන්වා දීම හා පරිගණක උපකරණ මෘදුකාංග හා ස්ථාවර වත්කම් ලේඛනය සකස් කිරීමේ ප්‍රගතිය පරීක්ෂා කිරීම.
- මූල්‍ය විගණනය (පොදු තැන්පත් ගණුම, මුදල් පොත් බැංකු සැසැඳුම් පරීක්ෂා කිරීම).
- මාතර දිස්ත්‍රික් සංඛ්‍යාලේඛන අංශයේ සාමාන්‍ය පරිපාලනය සම්බන්ධ විගණන පරීක්ෂාව
- 16 වන අංශයේ නිවාඩු පරීක්ෂා කරන ලදී.
- 2015 අප්‍රේල් , මැයි මාස වල වවුචර් පරීක්ෂා කර වාර්තාවක් ඉදිරිපත් කරන ලදී.
- ප්‍රධාන ගබඩාවේ තිබූ භාණ්ඩ හා ලේඛන පරීක්ෂා කර වාර්තාවක් ඉදිරිපත් කරන ලදී.
- ආර්ථික සංගණනය 2013/14 හා ප්‍රජාවිද්‍යා හා සෞඛ්‍ය සමීක්ෂණ කටයුතු වල ප්‍රගතිය පරීක්ෂා කරන ලදී.
- වැටුප් ලේඛන නියැදි පරීක්ෂාව , වැටුප් රහිත නිවාඩු නියැදි පරීක්ෂාව, වැටුප් පාලන ගිණුමක් සකස් කිරීමට උපදෙස් ලබාදීම සිදු කරන ලදී.

- ක්‍රියාකාරී සැලැස්ම සහ ප්‍රසම්පාදන සැලැස්මේ ප්‍රගතිය පරීක්ෂා කර බලා වාර්තා කරන ලදී. පුස්තකාල පොත් සංරක්ෂණය හා පොත්පත් සමීක්ෂණයක් සිදු කල යුතු බව පෙන්වා දෙන ලදී.
- දෙපාර්තමේන්තුවේ සනීපාරක්ෂණ හා උද්‍යාන සේවක වැඩ හා ගෙවීම් පිළිබඳ විගණන පරීක්ෂාවක් සිදු කරන ලදී.
- ක්ෂේත්‍ර කළමණාකරණ අංශයේ නිවාඩු පරීක්ෂා කිරීම.
- අත්තිකාරම් B ගිණුම පරීක්ෂා කර වාර්ථාවක් ඉදිරිපත් කරන ලදී.
- 2015 වර්ෂය සඳහා විගණන කළමණාකරණ කමිටු රැස්වීම් හතරක් පවත්වන ලදී.

## 4. මූල්‍ය වාර්තාව - 2015

2015 වර්ෂය සඳහා අදාල සීමාවන් යටතේ වන මුළු ඇස්තමේන්තුගත වියදම රු.1,287,235,338 (මිලියන 1,287.23)කි. මේ අතරින් රු.812,250,000 (මිලියන 812.25) ක් පුනරාවර්තන වියදම් ඇස්තමේන්තු වන අතර රු.474,985,338 ක්(මිලියන 474.98) ප්‍රාග්ධන වියදම් ඇස්තමේන්තුවේ. "පුනරාවර්තන වියදම් 2015" වගුව අනුව සත්‍ය වශයෙන් දරන ලද පුනරාවර්තන වියදම රු. 805,376,439 (මිලියන 805.37)ක් වේ. "ප්‍රාග්ධන වියදම් 2015" වගුවෙහි දක්වා ඇති පරිදි සත්‍ය වශයෙන් දරන ලද ප්‍රාග්ධන වියදම රු. 230,658,167 (මිලියන 230.65) කි.

පුනරාවර්තන වියදම්: ඇස්තමේන්තු වියදම හා සත්‍ය වියදම අතර වෙනස

ඉහත වර්ගකිරීම් යටතේ ඇස්තමේන්තුගත වියදම හා සත්‍ය වියදම අතර සුළු වෙනසක් දැකිය හැකි අතර ඊට හේතු පහත දැක්වේ.

- වර්ෂය තුල කුලී පදනම මත වාහන ලබා ගැනීමට අවශ්‍ය නොවීම
- සුළු අළුත්වැඩියා සහ නඩත්තු වියදම අඩුවීම

ප්‍රාග්ධන වියදම්: ඇස්තමේන්තු වියදම හා සත්‍ය වියදම අතර වෙනස

- අපේක්ෂිත පරිදි යන්ත්‍ර වල විශාල අළුත්වැඩියා සිදු කිරීමට අවශ්‍ය නොවීම
- ගිවිසුම් ගත කාර්යය එම වසරේ සම්පූර්ණ නොවීම
- වවුචර වර්ෂය තුළ ගෙවීමට ඉදිරිපත් නොවීම
- ගොඩනැගිලි ඉදිකිරීමේ කාර්යයට ඉඩම් නිරවුල් නොවීම

ශීර්ෂය :252 ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

වැඩ සටහන : 01 මෙහෙයුම් වැඩ සටහන

ව්‍යාපෘතිය : පරිපාලනය සහ ජාතික සංඛ්‍යාලේඛන

**පුනරාවර්තන වියදම් 2015**

| ව්‍යාපෘතිය | වැය විෂයය | 2015 ඇස්තමේන්තුව (මුළුශුද්ධ වෙන්කිරීම) රුපියල් | 2015 සත්‍ය වියදම රුපියල් |
|---|---|---|---|
| 1 | 1. පුද්ගලික පඩිනඩි | 669,750,000 | 667,167,544 |
| | 2. වෙනත් පුනරාවර්තන වියදම් | 142,500,000 | 138,208,895 |
| | **එකතුව** | **812,250,000** | **805,376,439** |

**ප්‍රාග්ධන වියදම් 2015**

| ව්‍යාපෘතිය | වැය විෂයය | 2015 ඇස්තමේන්තුව (මුළුශුද්ධ වෙන්කිරීම) රුපියල් | 2015 සත්‍ය වියදම රුපියල් |
|---|---|---|---|
| 1 | 1.මූලධන වත්කම්වල පුනරුත්ථාපන හා වැඩිදියුණු කිරීම | 12,900,000 | 10,115,674 |
| | 2. මූලධන වත්කම්වල අත්පත් කර ගැනීම | 285,000,000 | 112,122,743 |
| | වෙනත් මූලධන වියදම් | 177,085,338 | 108,419,750 |
| | **එකතුව** | **474,985,338** | **230,658,167** |

**ර.නි.අ.බි. ගිණුම 25201 – 2015**

| | අනුමත සීමාව රුපියල් | සත්‍යසීමාව රුපියල් |
|---|---|---|
| උපරිම හර සීමාව | 51,760,000.00 | 44,709,426.44 |
| උපරිම බැර සීමාව | 31,760,000.00 | 35,450,039.14 |
| හර ශේෂයේ උපරිම සීමාව | 220,000,000.00 | 147,543,450.00 |